# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1543/5 - 2008 මාර්තු 31 වැනි සඳුදා - 2008.03.31

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ 2007 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය

| | | |
|---|---|---|
| සහතිකය සටහන් කළේ | : | 2007.12.13 |
| අනුමැතිය ලැබුනේ | : | 2008.03.12 |

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ශ්‍රියානි පද්මලතා,
සභා ලේකම්.

සභා ලේකම් කාර්යාලය,
සබරගමුව පළාත් සභාව.

සබරගමුව පළාත් සභාව

සමුපකාර සමිති ප්‍රඥප්තිය

*2007 අංක 03*

සබරගමුව පළාතේ සමුපකාර සමිති සංවර්ධන කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද සමුපකාර සමිති පිහිටුවීම සහ පරිපාලනය කිරීමට අදාළ නීතිය නිශ්චය කොට දැක්වීම සඳහා ද, ඒට සම්බන්ධ හෝ ආනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

මෙම ප්‍රඥප්තිය පැනවීම මගින් මීට පෙර මෙම පළාත් සභාව විසින් පනවා ඇති 1994 අංක 03 දරන සබරගමුව සමුපකාර ප්‍රඥප්තිය මෙයින් අවලංගු හා අහෝසි වේ. 1994 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය අහෝසි හා අවලංගු වන බව.

01. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2007 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්වේ. ලුහුඬු නාමය.

1A - PG 000891 — 1,430 (2008/03)

*I වැනි පරිච්ඡේදය*

*ලියාපදිංචි කිරීම*

රෙජිස්ට්‍රාර් නියෝජ්‍ය හා සහකාර රෙජිස්ට්‍රාර්වරුන් පත්කිරීම හා සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ හා ඒ කොමසාරිස්ට සහායවීම සඳහා පත්කරන ලද තැනැත්තන්ගේ බලතල

02. (1) ශ්‍රී ලංකාවේ සබරගමු පළාත් සඳහා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයෙකු හා අවශ්‍ය විය හැකි යම් නියෝජ්‍ය හෝ ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරුන් ගණනක් පත් කරනු ලැබිය හැකිය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් රීති යටතේ රෙජිස්ට්‍රාර්වරයෙකු සතු සියළුම බලතල හෝ ඉන් යමක්, යම් නියෝජ්‍ය හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකු වෙත හෝ සමුපකාර සංවර්ධන නිලධාරිවරයෙකුට පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් විසින් සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක් මගින් පැවරිය හැකිය.

(3) සමුපකාර සංවර්ධන කොමසාරිස් වශයෙන් හෝ සමුපකාර සංවර්ධන කොමසාරිස් වශයෙන් තත් කාලයේ ක්‍රියා කිරීමට හෝ කරනු ලබන තැනැත්තාට මේ ප්‍රඥප්තියෙන් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ හෝ සාදනු ලැබ ඇතැයි සැළකෙන යම් රීතිවලින් සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පවරනු ලැබූ බලතලම තිබිය යුතු අතර ඔහු විසින් ඒ බලතල ක්‍රියාවෙහි යෙදවිය හැකිය.

(4) සමුපකාර සංවර්ධන කොමසාරිස්ට සහාය වීම පිණිස පත් කරනු ලබන එක් එක් තැනැත්තාට මේ ප්‍රඥප්තිය යටතේ හා ඒ යටතේ සාදනු ලැබූ හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන යම් සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි බලතල තිබිය යුතු අතර ඒ එක් එක් තැනැත්තා විසින් ඒ බලතල ක්‍රියාත්මක කළ හැකිය.

ලියාපදිංචි කරනු ලැබිය හැකි සමිති.

03. (1) මෙහි මින්මතු ඇතුළත් කරනු ලබන විධිවිධානවලට යටත්ව-

(අ) සමිතියේ සාමාජිකයින්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික ආශක්ථතා දියුණු කිරීම අරමුණු කරගත් සහ ස්වේච්ඡාවෙන් සංවිධානය වූ සමුපකාර අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් සමුපකාර ප්‍රතිපත්ති හා සාරධර්මවලට අනුකූලව ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකින් යුක්ත සංවිධානයක් හා ව්‍යාවසායකයක් ලෙස පවත්වාගෙන යාම අරමුණු කර ගත් යම් සංවිධානයක් ;

(ආ) (අ) වන ඡේදයේ සඳහන් සමිතිවල ක්‍රියාකාරිත්වය පහසු කිරීමේ අරමුණු ඇතිව පිහිටුවන ලද ස්වකීය සාමාජිකයින් වශයෙන් ලියාපදිංචි සමිතිවලින් සමන්විත සමිති සංගමයක් ;

(ඇ) සීමාසහිත වගකීමක් ඇතිව පමණක් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ හැකිය.

(2) ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් නොවන කිසිම සාමාජිකයකු විසින් පහෙන් එකක උපරිම ප්‍රමාණයකට යටත්ව ඒ සමිතියේ කොටස් ප්‍රාග්ධනයෙන් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයකට වැඩි ප්‍රමාණයක් නොදැරිය යුතුය.

ලියාපදිංචි කිරීමේ කොන්දේසි.

04. (1) (අ) සාමාජිකයින්ගෙන් පමණක් සමන්විත වන අවස්ථාවක සාමාජිකත්වය වයස අවුරුදු 18 ට නොඅඩු වූද සමිතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටින්නාවූ හෝ සේවයෙහි නියුක්ත සිටින්නා වූ ; හෝ

නිශ්චල දේපළ අයත්ව සිටින්නාවූ ද, සමිතිය විසින් ඉටු කරනු ලබන සේවාවන් උපයෝගී කිරීමේ ශක්නුතාවය ඇත්තාවූ ද, සාමාජිකයින් යටත් පිරිසෙයින් 20 දෙනෙකුගෙන්වත් සමන්විත නොවන්නේ නම්; හෝ

(ආ) ලියාපදිංචි සමිතිවලින් පමණක් සමන්විත වන ද්විතිය සමිතියක් වන අවස්ථාවක, යටත් පිරිසෙයින් සාමාජිකයින් 5 දෙනෙකු හෝ එකම ව්‍යාපාරික අරමුණින් එම දිස්ත්‍රික්කය තුළ වෙනත් සංගමයක් ලියාපදිංචි වී නැත්නම් පමණක් ; හෝ

(ඇ) (1) සමිතිය විසින් නිරතවීමට යෝජනා කරනු ලබන කටයුතු ආර්ථික වශයෙන් ශක්‍ය නොවන බව;

(11) සමිතිය විසින් යෝජිත අතුරු ව්‍යවස්ථාව මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් රීතිවල විධිවිධානවලට අනුකූල නොවන බවට; හෝ

(ඈ) යෝජිත අතුරු ව්‍යවස්ථාව තත් කාර්යය සඳහා යථා පරිදි කැඳවන ලද මහා සභා රැස්වීමකදී සම්මත කරනු ලැබ නොමැති නම්; හෝ

(ඉ) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය අත්සන් කරන සියළුම සාමාජිකයින් විසින් තම සාමාජිකත්වය සම්බන්ධයෙන් වූ ගෙවීම් සම්පූර්ණ කොට නොමැති නම්; හෝ

(ඊ) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන සියළු තොරතුරු සැපයීම ඒ සමිතිය විසින් පැහැර හැර ඇත්නම්; හෝ

(උ) යෝජිත සමිතියේ ආර්ථික හා සංවිධාන ශක්‍යතාවය මාස 3 ක් තුළ ක්‍රියාත්මකව පැවති බව ඔප්පු කර නැත්නම් හෝ කිසිම සමිතියක් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි නොකළ යුතුය.

(2) යම් සමිතියක් හෝ සමිති සංගමයක් ලියාපදිංචි කිරීමේදී ඉහත දක්වා ඇති වයස් සීමාව නිදහස් කිරීමේ හෝ වෙනස් කිරීමේ බලය සමුපකාර සංවර්ධන කොමසාරිස් / රෙජිස්ට්‍රාර්වරයාට ඇත්තේය.

(3) මේ වගන්තියේ කාර්යයන් සඳහා ඉහතින් වූ විධිවිධානවල සඳහන් කොන්දේසි සෑහීමකට පත්කර ඇති බවට යම් ප්‍රශ්නයක් පැන නගින අවස්ථාවක, රෙජිස්ට්‍රාර් විසින් ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් තීරණය කළ යුතු අතර, ඒ තීරණය අවසානාත්මක විය යුතුය.

(4) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම සමිතියකම නමෙහි සීමාසහිත යන වචනය මුල් වචනය විය යුතුය. නැතහොත් එහි දෙමළ හෝ ඉංග්‍රීසි සමාන වචනය ඒ නමේ කොටසක් විය යුතුය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

05. (1) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා ඉල්ලුම් පත්‍රයක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) එම ඉල්ලුම් පත්‍රය -

(අ) ප්‍රාථමික සමිතියක් සම්බන්ධයෙන් වූ විට (4)(1)(අ) වන වගන්තියේ නියමයන් අනුව සුදුසුකම් ලත් තැනැත්තන් යටත් පිරිසෙයින් 20 දෙනෙකු විසින්වත් අත්සන් කරනු ලැබිය යුතුය.

(ආ) ද්විතීය සමිති සංගමයක් වූ විට, ලියාපදිංචි කළ එවැනි සෑම සමිතියක් වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් අත්සන් කළ යුතුය.

(3) ඉල්ලුම් පත්‍රය සමග-

(අ) යෝජිත අතුරු ව්‍යවස්ථාවල පිටපත් දෙකක් ද,

(ආ) සමිතිය නිරත වීමට යෝජනා කරනු ලබන ආර්ථික කටයුතුවලට අදාළ ශක්‍යතා වාර්තාවක් ද,

(ඇ) සමිතිය ලියාපදිංචි කිරීම පිණිස යෝජනාව සම්මත කරනු ලැබූ මහ සභා රැස්වීම් වාර්තාවේ සහ පැමිණීම සම්බන්ධයෙන් විස්තර සහ අතුරු ව්‍යවස්ථාව සම්මත කර ගනු ලැබූ වාර්තාවේ සහතික පිටපතක් ද,

(ඈ) ඉල්ලුම්පත්‍රය අත්සන් කරන සාමාජිකයින් විසින් සාමාජිකත්වය සම්බන්ධයෙන් වූ සියළුම ගෙවීම් කළ බව ස්ථිර කෙරෙන සහ ඒ මුදල් එම කාරක සභාවේ භාරකාරත්වයෙහි පවතින බවට සමිතියේ කාරක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් ද,

(ඉ) සමිතිය ආර්ථික හා සංවිධාන ශක්‍යතාවයෙන් පසුගිය මාස 03 තුළ ක්‍රියාත්මක වූ බවට රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරි-යෙකුගෙන් ද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

06. සමිතියක් විසින් මේ ප්‍රඥප්තියේ හා රීතිවල විධිවිධාන අනුව ක්‍රියාකර ඇති බවට, ඒ සමිතිය නියුක්ත වීමට අදහස් කරන කටයුතු ආර්ථික වශයෙන් ශක්‍ය බවට හා සමිතියේ යෝජිත අතුරු ව්‍යවස්ථාව මේ ප්‍රඥප්තියට හෝ රීතිවලට පටහැනි නොවන බවට හා අදාළ සමිතිය යටත් පිරිසෙයින් මාස 03 ක් වත් ක්‍රියාකාරිත්වයේ තිබූ බවට රෙජිස්ට්‍රාර් සෑහීමකට පත්වන්නේ නම්, තමා සුදුසු යයි සළකතොත්, ඔහු විසින් ඒ සමිතිය හා එහි අතුරු ව්‍යවස්ථා ලියාපදිංචි කළ හැකිය. යම් සමිතියක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර් විසින් ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ආයාචනයක්, ඒ සම්බන්ධයෙන් සාදනු ලැබූ රීති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකිවිය යුතුය. ලියාපදිංචි කිරීම පිළිබඳ ඉල්ලීමක් ලැබී දින 60 ක් ඇතුලත එකී සමිතිය ලියාපදිංචි කළ හැකිය. යම් සමිතියක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර් වරයා විසින් ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඒ බව ඉල්ලුම්කරුට ඉහත දින 60 තුළ දැන්විය යුතුය. දින 60 තුල රෙජිස්ට්‍රාර් වරයා තම තීරණය නොදන්වන්නේ නම් එම දින 60 අවසානයේ එම සමිතිය ලියා පදිංචි වූ ලෙස සළකා රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි සහතිකයක් නිකුත් කල යුතුය. සමිතිය ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කල අවස්ථාවක එම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ආයාචනයක් රෙජිස්ට්‍රාර්වරයාගේ ලිපියේ සඳහන් දින සිට දින 30 ඇතුලත පළාතේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා වෙත ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම් පත්‍රයට අත්සන් කල ඕනෑම අයෙකුට ඉදිරිපත් කල හැකිය. එම අභියාචනයේ දින සිට දින 30 ඇතුලත අමාත්‍යවරයාගේ තීරණය දැන්විය යුතුය. අමාත්‍යවරයා ඒ පිළිබඳ තීරණයක් නොදෙන්නේ නම් රෙජිස්ට්‍රාර්ගේ තීරණය වලංගුවූවා සේ සැළකිය යුතුය.

ලියාපදිංචි කිරීමේ සාක්ෂි.

07. (1) 6 වන වගන්තිය යටතේ සමිතියක් ලියාපදිංචි කරනුලැබූ විට රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය.

(2) ඉහත 1 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය, ඒ සහතිකයෙහි සඳහන් සමිතියෙහි ලියාපදිංචි කිරීම අවලංගු කර ඇති බව ඔප්පු කරහොත් මිස, ඒ සමිතිය යථා පරිදි ලියාපදිංචි කරනු ලැබූ බවට තීරණාත්මක සහතිකයක් විය යුතුය.

ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම.

08. (1) යම් ලියාපදිංචි කළ සමිතියක් විසින්, මේ ප්‍රඥප්තිය හා ඒ යටතේ සැදනු ලැබූ රීතිවලට යටත්ව සමිතියේ නම ප්‍රකාශ කරන අතුරු ව්‍යවස්ථාව ඇතුළු සමිතියේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කළ හැකිය. සමිතියේ නම ප්‍රකාශ කරන අතුරු ව්‍යවස්ථාවක් රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන අවස්ථාවක එකී සමිතියේ ලියාපදිංචි නාමය එකී සංශෝධනයට අනුව ලියාපදිංචි සහතිකයේ රෙජිස්ට්‍රාර් විසින් සඳහන්කර සහතික කල යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියක කිසිම අතුරු ව්‍යවස්ථා සංශෝධනයක්, ඒ සංශෝධනය මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන තෙක් වලංගු නොවිය යුතුය. ඒ කාර්යය සඳහා ඒ සංශෝධනයේ පිටපත් දෙකක් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) අතුරු ව්‍යවස්ථාවල යම් සංශෝධනයක් මේ ප්‍රඥප්තියට හෝ රීතිවලට පටහැනි නොවන බවට රෙජිස්ට්‍රාර් සෑහීමකට පත් වන්නේ නම් තමා සුදුසු යයි සලකතහොත්, ඔහු විසින් ඒ සංශෝධනය ලියාපදිංචි කළ හැකිය.

(4) සමිතියක නාමයක් වෙනස් කරන සංශෝධනයක් ඒ සමිතියේ හෝ එහි යම් සාමාජිකයින්ගේ හෝ හිටපු සාමාජිකයින්ගේ යම් අයිතිවාසිකමක් හෝ බැඳීමක් කෙරෙහි බල නොපෑ යුතු අතර, එවකට පවත්නා යම් නීති කෘත්‍යයක් එහි අළුත් නාමය යටතේ ඒ සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරියටත් පවත්වා ගෙන යනු ලැබිය හැකිය.

(5) ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක, තමා විසින් සහතික කරන ලද ඒ සංශෝධනයේ පිටපතක් ඔහු විසින් සමිතිය වෙත නිකුත් කළ යුතුය. ඒ සංශෝධනය යථාපරිදි ලියාපදිංචි කර ඇති බවට ඒ සංශෝධනය සහතික කරනු ලැබූ පිටපත තීරණාත්මක සහතිකය විය යුතුය. අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳ ඉල්ලීමක් සළකා බලා දින 30 ක් ඇතුලත එය ලියාපදිංචි කිරීම හෝ ප්‍රතික්ෂේප කර අදාළ සමිතියට දැන්විය යුතු අතර, දින 30 ක් ඇතුලත ස්වකීය තීරණය සමිතියට දැන්වීමට අපොහොසත් වුවහොත්, එම අතුරු ව්‍යවස්ථා සංශෝධනය ලියාපදිංචි වූවා සේ සළකා කටයුතු කළහැකිය.

(6) මේ වගන්තියේ "සංශෝධන" යන්නට අළුත් අතුරු ව්‍යවස්ථාවක් සෑදීම හා අතුරු ව්‍යවස්ථාවක් වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම ඇතුලත් වේ.

ලියාපදිංචි කළ සමිතිවල වත්කම් හා බැරකම් ඒකාබද්ධ කිරීම බෙදීම සහ පැවරීම සහ සීමාරහිත සමිතියක් සීමාසහිත කිරීම.

09 (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් කලින් ලබාගත් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය ඇතිව සහ ඒ සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයින්ගෙන් හෝ නියෝජිතයින්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකකගේ වත් ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනාවකින්,

(අ) සමිතියේ වත්කම් හා බැරකම් සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක්, යම් ලියාපදිංචි කරනු ලැබූ අන්කිසි සමිතියකට පැවරීම; හෝ

(ආ) සමිතිය, සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් වශයෙන් බෙදා වෙන්කර ගැනීම හෝ කළ හැකිය.

(2) යම් ලියාපදිංචි කළ සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් විසින්, කලින් ලබාගත් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය ඇති හා ඒ එක් එක් සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයින්ගෙන් හෝ නියෝජිතයින්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකකගේවත් ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනාවකින් ඒකාබද්ධව අළුත් සමිතියක් පිහිටුවා ගත හැකිය.

(3) (අ) ලියාපදිංචි කළ සමිතියක් විසින් (1) වැනි උපවගන්තියේ හෝ (2) වන උපවගන්තිය යටතේ සම්මතකර ගනු ලබන යෝජනාවක අවස්ථාවෝචිත පරිදි පැවරීම බෙදාවෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳ සියලු විස්තර අඩංගු විය යුතුය.

(ආ) (1) යෝජිත පැවරීම බෙදීම හෝ ඒකාබද්ධවීම ආර්ථික වශයෙන් ශක්‍ය නොවන්නේ නම්,

(11) ලියාපදිංචි සමිතිය අවස්ථාවෝචිත පරිදි බෙදා ඇත්තේ යම් සමිතිවලට ද, නැතහොත් ඒකාබද්ධව ඇත්තේ යම් සමිති සමග ද, ඒ සමිතිවල අතුරු ව්‍යවස්ථා මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක විධිවිධානවලට අනුකූල නොවන්නේ නම්, ස්වකීය වත්කම් හා බැරකම් වෙනත් යම් ලියාපදිංචි සමිතියකට පැවරීමට හෝ එම සමිතිය, සමිති දෙකකට හෝ වැඩි ගණනකට බෙදීමට හෝ වෙනත් ලියාපදිංචි සමිතියක් සමග ඒකාබද්ධ වීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමැතිය දෙනු නොලැබිය යුතුය.

(4) ලියාපදිංචි කළ සමිතියක් විසින් එවැනි යම් යෝජනාවක් සම්මත කරනු ලැබූ අවස්ථාවක, ඒ සමිතිය විසින් සමිතියේ සියළු සාමාජිකයින් හා ණය හිමියන් වෙත ලිඛිත දැන්වීමක් කළ යුතු අතර, පටහැනි අතුරු ව්‍යවස්ථා හෝ ගිවිසුමක් ඇතද,එය නොතකා යම් සාමාජිකයකු හෝ ණය හිමියකු වෙත ඒ දැන්වීම භාරදීමේ දිනයෙන් පසු එක් මාසයක කාලය තුල, අවස්ථාවෝචිත පරිදි තම කොටස් තැන්පතු හෝ ණය මුදල් ඉල්ලා අස්කර ගැනීමට තෝරා ගැනීමේ බලය, ඒ සාමාජිකයාට හෝ ණය හිමියාට තිබිය යුතුය.

(5) (4) වැනි උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුලත තම තෝරා ගැනීමේ බලය ක්‍රියාවෙහි නොයොදවන යම් සාමාජිකයකු හෝ ණය හිමියකු විසින් යෝජනාවෙහි අඩංගු කරුණුවලට කැමැත්ත දක්වනු ලැබූ ලෙස සැළකිය යුතුය.

(6) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ වගන්තිය යටතේ සම්මත කරගත් යෝජනාවකට, යම් වත්කම් හා බැරකම් පැවරීමක් ඇතුලත් වන අවස්ථාවක, තත් කාලයෙහි බලපවත්නා, යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, එය නොතකා ඒ සම්මත කරගත් යෝජනාව තවදුරටත් තහවුරු කිරීමක් නොමැතිව, පැවරීම්ලාභීන් වෙත ඒ වත්කම් හා බැරකම් සතු කිරීමේ ප්‍රමාණවත් පැවරීමක් ලෙස සළකනු ලැබිය යුතුය.

(7) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙර සීමාරහිත වගකීමක් යටතේ ලියාපදිංචි කර ඇති සමුපකාර සමිතියක් සීමාසහිත සමිතියක් ලෙස පරිවර්තනය කිරීමේදී එකී සමිතියේ සාමාන්‍ය ගණපූරණය සහිත මහසභා රැස්වීමකට පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් 2/3 ක ගේ වත් කැමැත්තෙන් යෝජනාවක් සම්මත කර ගත යුතු අතර නව අතුරු ව්‍යවස්ථාවක්ද එකී රැස්වීමේදී සම්මත කර ගත යුතුය. එසේම එකී සමිතියේ සාමාජිකයින්ට සහ ණය හිමියන්ට මෙම පරිවර්තනය පිළිබඳව ලිඛිතව දැන්වීමක් කලයුතු අතර පටහැනි අතුරු ව්‍යවස්ථාවක හෝ ගිවිසුමක කුමක් සඳහන් ව ඇත ද එය නොතකා යම් සාමාජිකයෙකුට හෝ ණය හිමියෙකුට දැන්වීමේ දිනයේ සිට මාසයක කාලය තුල අවස්ථාවෝචිත පරිදි තම කොටස් සම්බන්ධතා හෝ ණය මුදල් බලය ඒ සාමාජිකයාට හෝ ණය හිමියාට තිබිය යුතුය. එකී මාසයක කාලය තුල තම තෝරා ගැනීමේ බලය නොයොදවන සාමාජිකයෙකු හෝ ණය හිමියෙකු විසින් එකී පරිවර්තනයට කැමැත්ත දැක්වූ ලෙස සැලකිය යුතුය.

සීමාරහිත සමිතියක් සීමාසහිත ලෙස පිළිගනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින් එකී අතුරු ව්‍යවස්ථාව ලියාපදිංචිකර 8(1) වගන්තිය ප්‍රකාර ලියාපදිංචි සහතිකය සංශෝධනය කල යුතුය.

සීමාරහිත සමිතියක් සීමාසහිත සමිතියක් ලෙස කරන පරිවර්තනයක් ඒ සමිතිය හෝ එහි යම් සාමාජිකයින් ගේ හෝ හිටපු සාමාජිකයින්ගේ යම් අයිතිවාසිකමක් හෝ බැඳීමක් කෙරෙහි බලනොපෑ යුතු අතර ඒවන විට ආරම්භකර තිබූ යම් නීති කෘත්‍යයක් එහි අලුත්නාමය යටතේ ඒ සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරියටත් පවත්වාගෙන යනු ලැබිය හැකි අතර ඒවා වලංගු විය යුතුය.

ඇතැම් අවස්ථාවල දී ලියාපදිංචිකල ලියාපදිංචි කිරීමේ සහතික අවලංගු කිරීම.

10 (1) ලියාපදිංචි කල සමිතියක වත්කම් හා බැරකම් සියල්ලම වෙනත් ලියාපදිංචි කළ සමිතියකට 9 වැනි වගන්තියේ විධි විධාන අනුව පවරනු ලැබූ අවස්ථාවක, පළමුව සඳහන් කරනු ලැබූ සමිතියේ ලියාපදිංචි කිරීම අවලංගු විය යුතු අතර, ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් 9 වැනි වගන්තියේ විධිවිධාන අනුව අළුත් සමිතියක් වශයෙන් ඒකාබද්ධ කරනු ලැබූ අවස්ථාවක, ඒ එක් එක් සමිතියේ ලියාපදිංචි කිරීම අළුත් සමිතිය ලියාපදිංචි කරනු ලැබූ දිනයෙහි අවලංගු විය යුතු අතර, ඒ එක් එක් සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම, සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතුය.

(3) ලියාපදිංචි කල සමිතියක් 9 වැනි වගන්තියේ විධි විධාන අනුව සමිති දෙකකට හෝ වැඩි ගණනකට වෙන්ව බෙදී යන අවස්ථාවක, ඒ සමිතියේ ලියාපදිංචි කිරීම අළුත් සමිති ලියාපදිංචි කිරීමෙන් පසු අවලංගු විය යුතු අතර, ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සළකනු ලැබිය යුතුවාක් මෙන්ම, සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතුය.

## *II වැනි පරිච්ඡේදය*

### *ලියාපදිංචි කරනු ලැබූ සමිතිවල සාමාජිකයන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා වගකීම්*

අයවිය යුතු ගෙවීම් කරනු ලබන තෙක් සාමාජික අයිතිවාසිකම් පාවිච්චි නොකළ යුතු බව කොටස් මිළට ගැනීම සඳහා ගෙවීමේ ආකාරය.

11 (1) සාමාජිකත්වය සම්බන්ධයෙන් රීති වලින් හෝ අතුරු ව්‍යවස්ථා වලින් නියම කරනු ලැබිය හැකි යම් ගෙවීමක් තමා විසින් කරනු ලැබ ඇත්නම් මිස හෝ කරනු ලබන තෙක්, නැතහොත් සමිතියෙහි එසේ නියම කරනු ලැබිය හැකි යම් සම්බන්ධතාවයක් අත්කර ගනු ලැබ ඇත්නම් මිස හෝ අත්කර ගනු ලබන තෙක්, ලියාපදිංචි කල සමිතියක කිසිම සාමාජිකයකු විසින් සාමාජිකයකුගේ අයිතිවාසිකම් පාවිච්චි නොකළ යුතු ය.

(2) සාමාජික කොටස් මුදල හා ගෙවීම් පරිපාටිය අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් විය යුතුය. කොටසක සම්පූර්ණ වටිනාකම එක් වාරිකයකින් ගෙවනු ලැබුවද, බඳවා ගැනීමේ දින සිට එක් වර්ෂයක් ඉකුත් වන තෙක් ඡන්දය දීමේ අයිතිය හා ධුර දැරීමේ අයිතිය සාමාජිකයකු විසින් බුක්ති විඳිනු නොලැබිය යුතුය.

(3) එසේ වුවද, කිසියම් කාල සීමාවක් තුල සමිතිය සමග ගණුදෙනු කිරීමේ අවම සීමාවන් නියම කිරීම සඳහා එම නියමයන් පරිදි කටයුතු නොකරනු ලබන සාමාජිකයන්ගේ ඡන්ද බලය සහ ධුරවලට පත්වීම සීමා කිරීමේ විධිවිධාන ඇතුළත් අතුරු ව්‍යවස්ථා සකස් කිරීම සඳහා සමුපකාර සමිතියකට බලය තිබිය යුතුය.

එතකුදු වුවත්, මේ ප්‍රඥප්තියේ (4)(1)(අ) සහ (4)(1)(ආ) සහ 5(2) වගන්තිවලින් අනුදත් පරිපාටිය යටතේ සමිතියක් අළුතින් ලියාපදිංචි කිරීමට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කරන පුද්ගලයන් සඳහා මෙය බල නොපැවැත්විය යුතුය.

ඡන්දය දීමේ සුදුසුකම්.

(4) පූර්ණ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසුව පමණක් ලියාපදිංචි සමිතියක ඕනෑම රැස්වීමක දී ඡන්දය දීමට සහ නිලයකට තෝරා පත් කරනු ලැබීමට සාමාජිකයනට හිමිකම ඇත්තේය.

නුසුදුසුකම්.

(5) පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක, මහනගර සභාවක, නගර සභාවක, ප්‍රාදේශීය සභාවක හෝ වෙනත් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු වන කිසිම, මහජන නියෝජිතයෙකු ලියාපදිංචි සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභාවේ සාමාජිකයකු මහ සභා නියෝජිතයකු වශයෙන් ඉදිරිපත්වීමට හෝ තෝරා පත්කර ගනු ලැබීමට හෝ තවදුරටත් එලෙස ධුරය දැරීමට සුදුස්සකු නොවන්නේය.

සභාපතිවරයා ලෙස තෝරා පත්කිරීම සඳහා නුසුදුසුකම්.

(6) යම් තැනැත්තෙක් තෝරා පත්කර ගන්නා දිනයේදී, සාමාජිකත්වය ලියාපදිංචි සමිති වලින් සමන්විත වන වෙනත් යම් සමිති සංගමයක සභාපතිව සිටින්නේ නම්, ඒ තැනැත්තා සාමාජිකත්වය ලියාපදිංචි සමිති වලින් සමන්විත වන පළමු සංගමයේ පරමාර්ථවලට සමාන නොවන පරමාර්ථ ඇත්තාවූ සංගමයක, සභාපති ලෙස තෝරා පත් කර ගනු ලැබීමට හෝ තවදුරටත් එලෙස ධුරය දැරීමට සුදුස්සකු නොවන්නේය.

12. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින්, සමිතියේ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ගිවිසුමකට එළඹෙන කවර හෝ පුද්ගලයෙකු ආශ්‍රිත සාමාජිකයකු වශයෙන් ඇතුළත් කර ගත හැකිය. ආශ්‍රිත සාමාජිකයන්.

(2) ආශ්‍රිත සාමාජිකයකුට සමිතියේ වත්කම්වල හෝ ලාභවල කවර ආකාරයේ වූ හෝ කොටසකට හෝ සමිතියේ කටයුතු කර ගෙන යාමෙහි ලා යම් ඡන්ද බලයකට හිමිකම නොලැබිය යුතුවාක් මෙන්ම, සමිතියෙන් මුදල් ණයට ගැනීමට ද හිමිකමක් නො තිබිය යුතුය.

(3) මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, ආශ්‍රිත සාමාජිකයකුට සමිතියේ අතුරු ව්‍යවස්ථා වලින් නිශ්චිතවම සඳහන් කරනු ලැබිය හැකි සාමාජිකයකුගේ වරප්‍රසාද සහ අයිතිවාසිකම් තිබිය යුතු අතර, සාමාජිකයකුගේ යම් වගකීම්වලට ද ඔහු යටත්විය යුතුය.

(4) ආශ්‍රිත සාමාජිකයකු හා සමිතියක් අතර ඇති වන යම් ආරවුලක්, මේ ප්‍රඥප්තියේ 58 වැනි වගන්තිය යටතේ බේරුම්කර ගත යුතුය.

13. යම් ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කර ගනු ලැබූ යම් තැනැත්තකු ගේ බාල වයස හෝ ඔහු නිසි වයසට නොපැමිණීම, මේ ප්‍රඥප්තිය යටතේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති යටතේ ඔහු විසින් ලියා අත්සන් කරනු ලැබීම අවශ්‍ය නීත්‍යානුකූල ලේඛනයක් ලියා අත්සන් කිරීමට හෝ දෙනු ලැබීම අවශ්‍ය නිදහස් කිරීමක් දීමට, ඔහුට බාධාවක් නොවිය යුතුය. තව ද, එවැනි යම් තැනැත්තකු විසින් සමිතියක් සමග ඇති කර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම සඳහා හෝ මග හරිනු පිණිස, ඒ කරුණ හේතුවක් නොවිය යුතුය. එමෙන්ම, එවැනි යම් තැනැත්තකු විසින් ප්‍රධාන පාර්ශවකරු හෝ ඇපකරු වශයෙන් සමිතියක් සමග ඇතිකරගත් එවැනි යම් ගිවිසුමක්, ඔහුගේ බාල වයස හෝ නිසි වයසට නොපැමිණීම නොතකා ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට විරුද්ධව නීතිය අනුව ක්‍රියාත්මක කළ හැකි විය යුතුය. බාල වයස්කරුවන් වන සාමාජිකයන් විසින් සමිතිය සමග ඇතිකර ගනු ලබන ගිවිසුම්.

14. ලියාපදිංචි කළ සමිතියක යම් නිලධාරියකු පත්කිරීමෙහිලා වූ යම් දෝෂයක් හෝ ඔහු තෝරා පත්කර ගැනීම සඳහා යම් නුසුදුසුකමක් තදනන්තරව සොයා ගැනීම, ඒ සමිතිය වෙනුවෙන් ඒ නිලධාරියා විසින් ඇති කර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම හෝ මගහැරවීම සඳහා හේතුවක් නොවිය යුතුය. සමිතිවල නිලධරයන් විසින් ඇතිකර ගනු ලබන ගිවිසුම්.

15. යම් ප්‍රාථමික සමිතියක සාමාජිකයකුට, සමිතියේ කටයුතු පවත්වා ගෙන යාමෙහිලා එක් ඡන්දයකට වැඩියෙන් නො තිබිය යුතුය. එසේ වුවද, ඡන්ද සම සමව බෙදුනහොත් මුලසුන දරන්නා සාමාජිකයකු වන විට පමණක් තීරක ඡන්දයක් තිබිය යුතු ය. සාමාජිකයන්ගේ ඡන්ද.

16 (1) යම් ප්‍රාථමික සමිතියක සාමාජිකයකු විසින්, ඒ සමිතියේ යම් රැස්වීමකදී පෞද්ගලිකවම හැර තම ඡන්දය පාවිච්චි නොකළ යුතුය. එසේ වුවද, නියෝජිතයන්ගේ මාර්ගයෙන් ඡන්දය දීමට සමිතියේ අතුරු ව්‍යවස්ථා යටතේ විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, සමිතියේ යම් රැස්වීමක දී එසේ ඡන්දය දීමට ඉඩදිය හැකිය. ඡන්ද පාවිච්චි කිරීමේ ආකාරය.

(2) වෙනයම් ලියාපදිංචි සංගමයක සාමාජිකයකු වන ලියාපදිංචි කළ සමිතියක් විසින්, ඒ වෙන යම් ලියාපදිංචි කළ සංගමයේ කටයුතු පවත්වා ගෙන යාමෙහි ලා ඡන්දය දීමෙහි කාර්යය සඳහා ස්වකීය සාමාජිකයන්ගෙන් කෙනෙකු පත් කළ හැකිය.

17. (1) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකුගේ හෝ අතීත සාමාජිකයකුගේ හෝ මියගිය සාමාජිකයෙකුගේ හෝ ප්‍රාග්ධනයෙහි කොටස් හෝ වෙනත් සම්බන්ධතා පැවරීම සතුව සිටිය හැකි වැඩිම ප්‍රමාණය සම්බන්ධයෙන්, මේ ප්‍රඥප්තියෙන් හෝ රීතිවලින් නියම කරනු ලැබිය හැකි කොන්දේසි වලට යටත්විය යුතුය. කොටස් හා සම්බන්ධතා පැවරීම පිළිබඳ සීමා.

(2) ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට කිසිම සාමාජිකයකු විසින් -

(අ) තමා විසින් යම් කොටසක් හෝ ඒ සම්බන්ධතාවයක් එක් අවුරුද්දකට නොඅඩු කාලයක් දරන ලද්දේ නම් හා,

(ආ) සමිතිය වෙත හෝ සමිතියේ සාමාජිකයෙකු වෙත හෝ සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම් පත්‍රය කාරක සභාව විසින් පිළිගනු ලැබ සිටින තැනැත්තකු වෙත පැවරීම කරනු ලබන්නේ නම් මිස, තමා විසින් දරනු ලබන සමිතියේ ප්‍රාග්ධනයේ යම් කොටසක් හෝ සම්බන්ධතාවක් හෝ එහි යම් කොටසක් නොපැවරිය යුතුය.

*III වැනි පරිච්ඡේදය*

*ලියාපදිංචි සමිතිවල අයිතිවාසිකම්, බැඳීම් හා වරප්‍රසාද*

සමිතියේ ලිපිනය.

18. දැන්වීම් හා ලිපි යවනු ලැබිය හැකි, රීති අනුව ලියාපදිංචි කරනු ලැබූ ලිපිනයක් ලියාපදිංචි කළ සෑම සමිතියකටම තිබිය යුතු අතර, ඒ ලිපිනය සම්බන්ධයෙන් යම් වෙනසක් ඇතිවීමෙන් පසු දින 7 ක් ඇතුළත ඒ වෙනස, රෙජිස්ට්‍රාර් වෙත දැන්විය යුතුය.

ප්‍රඥප්තිය රීති අතුරු ව්‍යවස්ථා යනාදියෙහි පිටපතක් පරීක්ෂා කර බැලීමට තිබිය යුතු බව.

19. ලියාපදිංචි කළ සෑම සමිතියක් විසින්ම, මේ ප්‍රඥප්තියේ රීතිවල හා සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ පිටපතක් ද, සමිතියේ සාමාජිකයින්ගේ නාම ලේඛනයක් ද, විගණන වාර්තාව ද ගාස්තු ගෙවීමක් නොමැතිව, සියලු යුක්ති සහගත වේලාවලදී පරීක්ෂා කර බැලීම සඳහා සමිතියේ ලියාපදිංචි කරන ලද ලිපිනය දරන ස්ථානයේ තැබිය යුතුය.

*IV වැනි පරිච්ඡේදය*

*ලියාපදිංචි කළ සමිති සතු වරප්‍රසාද*

සමිති සංස්ථා විය යුතු බව.

20. සමිතියක් ලියාපදිංචි කිරීම හේතු කොටගෙන, එය ලියාපදිංචි කරනු ලැබූ නාමය යටතේ අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති හා දේපළ සතුව සිටීමේදී, ගිවිසුම්වලට ඇතුළත් වීමේද, නඩු හා වෙනත් නීති කෘත්‍ය පැවරීමේ හා ඒවා සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමේද, සමිතිය පිහිටුවීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු දේවල් කිරීමේද බලය සහිත සංස්ථාවක් විය යුතුය.

සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීම.

21. (1) කෘෂිකාර්මික හෝ සත්ව පාලනයමය ද්‍රව්‍ය හෝ යම් කර්මාන්තයක නිෂ්පාදනය වන යම් භාණ්ඩයක් විකිණීම එක් පරමාර්ථයක් වශයෙන් ඇති ලියාපදිංචි කළ සමිතියක් විසින්,

(අ) එවැනි යම් දෙයක් නිෂ්පාදනය කරන සමිතියේ සෑම සාමාජිකයකුම විසින් ඒ ද්‍රව්‍ය සම්පූර්ණයෙන් හෝ එහි නිශ්චිත කොටසක්, සමානුපාතයක් හෝ වර්ගයක් සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් විකිණිය යුතු බවට හා,

(ආ) අතුරු ව්‍යවස්ථා හෝ ගිවිසුම් කඩ කිරීමේ වරදට වරදකරු ලෙස රීතිවලින් නියම කළ හැකි ආකාරයකින් ඔප්පු කරනු ලැබූ හෝ තීන්දු කරනු ලැබූ. සාමාජිකයකු විසින් රීතිවලින් හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් නිශ්චිත කරනු ලබන හෝ තක්සේරු කරනු ලබන මුදලක් ප්‍රමාණකල අලාභය වශයෙන් සමිතියට ගෙවිය යුතු බවට සමිතියේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන සැලැස්වීම හෝ එහි සාමාජිකයන් සමග ගිවිසුමකට ඇතුළුවීම කළ හැකි ය.

(2) ලියාපදිංචි කළ සමිතියක් විසින් (1) වන උපවගන්තිය යටතේ ඇති කර ගත් ගිවිසුමකින්, ඒ ගිවිසුම අදාළ වන නිෂ්පාදිත හෝ නිෂ්පාදනය කරනු ලැබීමට ආසන්න සියලු ද්‍රව්‍යයන් කෙරෙහි සමිතියේ වාසියට පළමු බැඳීමක් ඇතිවිය යුතුය.

(3) (1) වැනි උපවගන්තිය යටතේ වූ ගිම්සුමකින් උද්ගත වන යම්කිසි නීති කෘත්‍යයකදී, ඒ ගිවිසුම ව්‍යාපාර තහනමක් වශයෙන් වූ ගිවිසුමක් යන්න නිදහසට කරුණක් නොවිය යුතුය.

(4) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයකු ඒ සමිතියේ සාමාජිකයකු වීමට පෙර තම ද්‍රව්‍ය වෙනයම් තැනැත්තකුට භාරදීමට ගිවිස ගෙන සිටීමේ හේතුව කරන කොටගෙන, ඒ ද්‍රව්‍ය ඒ ලියාපදිංචි කළ සමිතියට භාරදීමට ඔහු අපොහොසත් වූයේ නම්, ඒ නිෂ්පාදන ඒ සමිතියට භාරදීමට තමාට නියම කෙරෙන ඒ සමිතියේ යම් අතුරු ව්‍යවස්ථාවක්, ඒ සාමාජිකයා විසින් කඩ කරනු ලැබූ ලෙස නොසැළකිය යුතුය.

(5) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තකු විසින්, යම් ද්‍රව්‍යයක් වෙන යම් තැනැත්තෙකුට භාරදීම සඳහා තමා ඇති කරගත් සියලුම ගිවිසුම් පිළිබඳ විස්තර, තම ඉල්ලුම් පත්‍රයෙහි හෙළිදරව් කරන ලෙස නියම කරනු ලැබුවහොත්, එසේ කළ යුතුය.

ගිවිසුම් කඩකිරීමට අන්‍යයන් පොළඹවන තැනැත්තෝ.

22. (1) සාමාජිකයකු විසින් නිෂ්පාදනය කරන ලද යම් භාණ්ඩයක් ලියාපදිංචි කළ සමිතියකට හෝ ඒ සමිතිය මාර්ගයෙන් විකිණීමට, ඒ සාමාජිකයා 21 වැනි වගන්තිය යටතේ ගිවිස ගෙන සිටින බව දැන සිටියදී හෝ ඒ පිළිබඳ දැන්වීමක් ලද ඇතිව සිටියදී, අවස්ථාවෝචිත පරිදි ඒ ගිවිසුම කඩකරමින් ඒ භාණ්ඩය විකිණීමට හෝ භාරදීමට ඒ වෙනත් තැනැත්තා පොළඹවන හෝ කැමති කරවා ගන්නා යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, වෙනත් නීතියක විධිවිධාන නොසළකා, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථාවක, ඒ වරද කරන විට ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධාරියකුව සිටි සෑම තැනැත්තකුම, ඒ වරද සිදු කරන ලද්දේ තමා නොදැනුවත්ව හෝ ඒ වරද වැළැක්වීම සිදුකිරීම සඳහා නිසි සියලු උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

යම් සාමාජිකයකුට අයත් වගා කෘෂි ද්‍රව්‍ය, ගවයන් උපකරණ, අමුද්‍රව්‍ය හා නිෂ්පාදිත භාණ්ඩ.

23. ණයකරුවකුගේ දේපළ සම්බන්ධයෙන් ජනරජය හෝ පළාත් සභාවේ ප්‍රමුඛතා හිමිකමකට හා කුලී හෝ කුලී වශයෙන් අයකර ගත හැකි යම් මුදලක් සම්බන්ධයෙන් ඉඩම් හිමියකුගේ කැප අයිතියට හෝ හිමිකම් කියාපෑමට සහ නිශ්චල දේපළ සම්බන්ධයෙන් එහි කලින් ලියාපදිංචි කරන ලද යම් බැඳීමකට යටත්ව.

සම්බන්ධයෙන් ලියාපදිංචි කළ සමිතියක අයිතිවාසිකම්.

(අ) යම් සාමාජිකයකු හෝ කලින් සිටි සාමාජිකයකු විසින් ලියාපදිංචි කළ සමිතියකට ගෙවිය යුතු යම් ණයක් හෝ සපුරා නොමැති ඉල්ලීමක,

(i) ඒ සාමාජිකයා හෝ කලින් සිටි සාමාජිකයා විසින් සමිතියෙන් ලබාගත් ණය මුදලකින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වැවූ වගාවක් හෝ එසේ ලබාගත් වෙනත් කෘෂි ද්‍රව්‍යයක් හෝ කෙරෙහි පළමු බැඳීමක් විය යුතුය.

(ii) සමිතිය විසින් සාමාජිකයකුට හෝ කලින් සිටි සාමාජිකයකුට දෙන ලද මුදලින් හෝ භාණ්ඩවලින් වූ යම් ණයකින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ඔහුට සපයන ලද හෝ ඔහු විසින් මිලයට ගනු ලැබූ යම් ගවයන් සඳහා වූ ආහාර, කෘෂිකාර්මික හෝ කෘෂිකාර්මික උපකරණ හෝ නිෂ්පාදනයට ගන්නා අමුද්‍රව්‍ය හෝ කර්මාන්තශාලා, ගබඩා, ව්‍යාපාරික ස්ථාන හෝ කෙරෙහි පළමු බැඳීමක් විය යුතුය. එසේ වුවද, ඉහත ද්‍රව්‍ය දැනුම් දීමක් නොමැතිව සද්භාවයෙන් මිලට ගන්නා ගැණුම්කරුවකුගේ හෝ පැවරුම් ලාභියකුගේ හිමිකම් කෙරෙහි බල නොපෑ යුතුය.

තවද,

(ආ) ගෙවල් කුලිය, කොටස් ණය මුදල් හෝ ගැණුම් මුදල් සම්බන්ධයෙන් යම් සාමාජිකයකු හෝ අතීත සාමාජිකයකු විසින් සමිතියකට හෝ සංගමයකට ගෙවිය යුතු යම් සපුරා නොමැති ඉල්ලීම හෝ නොගෙවා ඇති ගාස්තු හෝ ඒ සමිතියට ගෙවිය යුතු වෙනයම් අයිතිවාසිකම් හෝ මුදල්, සමිතියේ නිශ්චල දේපළ පිළිබඳ ඔහුගේ සම්බන්ධතාව කෙරෙහි පළමු බැඳීමක් විය යුතුය.

සාමාජිකයින්ගේ කොටස් හෝ සම්බන්ධතා කෙරෙහි බැඳීම් හා හිලව් කිරීම්.

24. සාමාජිකයකුගෙන්, අතීත සාමාජිකයකුගෙන් හෝ මිය ගිය සාමාජිකයකුගේ බූදලයෙන්,

(අ) සමිතියට අයවිය යුතු යම් ණයක් ; හෝ

(ආ) අන් කිසි ලියාපදිංචි සමිතියකට අයවිය යුතු යම් ණයක්; හෝ

(ඇ) යම් කිසි ලියාපදිංචි කළ සමිතියක ඇවරකරුට අයවිය යුතු යම් ණයක් හෝ මුදලක් හෝ පියවීම සඳහා ඒ සාමාජිකයාගේ අතීත සාමාජිකයාගේ හෝ මියගිය සාමාජිකයාගේ ප්‍රාග්ධනයෙහි කොටස්, වෙනත් සම්බන්ධතා හා තැන්පතු කෙරෙහිද, ඒ සාමාජිකයාට හෝ අතීත සාමාජිකයාට හෝ මියගිය සාමාජිකයාගේ බූදලයට ගෙවිය යුතු යම් ලාභාංශයක්, ප්‍රසාද මුදලක් හෝ ලාභ කෙරෙහි ද, ලියාපදිංචි කළ සමිතියකට බැඳීමක් තිබිය යුතු අතර, සාමාජිකයකුට හෝ අතීත සාමාජිකයකුට හෝ මියගිය සාමාජිකයකුගේ බූදලයකට බැර කෙරෙන හෝ ගෙවිය යුතු යම් මුදලක් හිලව්වූ කිරීම හෝ එවැනි ණයක් හෝ මුදලක් ගෙවීමෙහි ලා හෝ ගෙවීම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි ඒ අන් සමිතියට හෝ ඇවරකරුට ගෙවීම, ඒ ලියාපදිංචි කළ සමිතිය විසින් කළ හැකිය.

කොටස් දායක මුදල් හා වෙනත් සම්බන්ධතා තහනම් කිරීමට හෝ විකිණීමට යටත් නොවන බව.

25. 24 වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව ලියාපදිංචි කළ සමිතියක ප්‍රාග්ධනයෙහි සාමාජිකයකුගේ කොටස, දායක මුදල හෝ වෙනත් සම්බන්ධතා ඒ සාමාජිකයා විසින් ඇති කර ගන්නා ලද යම් ණයක් හෝ වගකීමක් සම්බන්ධයෙන් අධිකරණයක යම් තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් යටතේ තහනමකට ගැනීමට හෝ විකිණීමට යටත් නොවිය යුතුය. එසේ බුන්වත්වීමේදී පත් කරනු ලබන ඔහුගේ පැවරුම්ලාභියාට හෝ සිවිල් නඩු විධාන සංග්‍රහයේ (L) වැනි පරිච්ඡේදය යටතේ පත් කරනු ලබන භාර ගන්නකුට ඒ කොටසට, දායක මුදලට හෝ වෙනත් සම්බන්ධතාවකට කිසිදු හිමිකමක් හෝ ඒ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑමේ කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

සාමාජිකයෙක් මියගිය විට සම්බන්ධතා පැවරීම.

26. (1) සාමාජිකයකු මියගිය පසු, ලියාපදිංචි කළ සමිතියක් විසින් ඒ මියගිය සාමාජිකයාගේ කොටස් හෝ වෙනත් සම්බන්ධතා ඒ වෙනුවෙන් සාදනු ලැබූ රීති අනුව නම් කරනු ලැබූ තැනැත්තකුට හෝ එසේ නම් කරනු ලැබූ කිසිම තැනැත්තකු නොසිටී නම්, මියගිය සාමාජිකයාගේ නිත්‍යානුකූල උරුමකරු හෝ නියෝජිතයා ලෙස කාරක සභාවට පෙනී යාහැකි වෙනයම් තැනැත්තකුට පැවරිය හැකිය නැතහොත් රීති හෝ අතුරු ව්‍යවස්ථා අනුව නිශ්චය කරනු ලැබූ ඒ සාමාජිකයාගේ කොටස් හෝ නිත්‍යානුකූල වෙනත් සම්බන්ධතාවයක් වටිනාකමට සමාන මුදලක් ඒ නම් කල තැනැත්තාට, උරුමකරුට හෝ නියෝජිතයාට ගෙවිය හැකිය.

(අ) එසේ වුවද, සමිතිය විසින් මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතා, සමිතියේ සාමාජිකත්ව සඳහා රීති හා අතුරු ව්‍යවස්ථා අනුව සුදුසුකම්ලත්, අවස්ථාවෝචිත පරිදි ඒ නම් කල තැනැත්තා, උරුමකරු හෝ නිත්‍යානුකූල නියෝජිතයා වෙත හෝ මිය ගිය තැනැත්තාගේ මරණයෙන් පසු හය මසක් ඇතුළත ඔහු විසින් කරනු ලබන ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබූ, එසේ සුදුසුකම් ලත් වෙනයම් තැනැත්තකු වෙත පැවරිය හැකිය.

(2) ලියාපදිංචි කල සමිතියක් විසින් ඒ සමිතියෙන් මියගිය සාමාජිකයාට ගෙවිය යුතු වෙනත් සියළු මුදල්, අවස්ථාවෝචිත පරිදි ඒ නම් කල තැනැත්තා, උරුමකරු හෝ නිත්‍යානුකූල නියෝජිතයා වෙත ගෙවිය යුතුය.

(3) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ වගන්තියේ විධිවිධාන අනුව කරන ලද සියළුම පැවරීම් හා ගෙවීම් වෙනයම් තැනැත්තකු විසින් සමිතියට ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමකට විරුද්ධව වලංගු හා බල සහිත විය යුතුය.

බාල වයස් කරුවකු විසින් හෝ ඔහු වෙනුවෙන් කරනු ලබන තැන්පත්.

27. (1) ලියාපදිංචි කල සමිතියක් විසින් බාල වයස්කරුවන්ගෙන් හෝ ඔවුන්ගේ අර්ථ ලාභය සඳහා තැන්පතු භාරගත හැකි අතර, ඒ තැන්පතු සම්බන්ධයෙන් ගෙවිය යුතු විය හැකි පොලිය, ඒ බාල වයස්කරුවන්ට ලියාපදිංචි කළ සමිතියක් විසින් ගෙවීම නිත්‍යානුකූල විය යුතුය. බාල වයස්කරු විසින් කරන ලද යම් තැන්පත් කිරීමක්, ඊට එකතු වූ පොලියත් සමග ඒ බාල වයස්කරුට ගෙවනු ලැබිය හැකිය. තවද බාල වයස්කරුවකු වෙනුවෙන් වූ යම් තැන්පත් කිරීමක් ඊට එකතු වූ පොලියත් සමග ඒ බාල වයස්කරුගේ ප්‍රයෝජනය සඳහා භාරකරු වෙත ගෙවනු ලැබිය හැකිය.

(2) මේ වගන්තිය යටතේ සමිතියක් විසින් යම් බාල වයස්කරුවකුට හෝ භාරකරුවකුට ගෙවන ලද මුදල් සඳහා ඔහුගෙන් ලබාගන්නා ලද ලදු පත, ඒ මුදල් සම්බන්ධයෙන් ඒ සමිතියේ වගකීම ඉටු කළ බවට ප්‍රමාණවත් නිදහස් කිරීමක් විය යුතුය.

සමිතියේ ණය සම්බන්ධයෙන් අතීත සාමාජිකයා හා මිය ගිය සාමාජිකයාගේ බූදලය බැඳී ඇති බව.

28. (1) අතීත සාමාජිකයකු, සාමාජිකයකුව සිටීම කෙළවර වූ දින පැවතියා වූ ලියාපදිංචි කළ සමිතියක ණය සම්බන්ධයෙන් ඔහුගේ බැඳීම, ඒ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් තුළ අඛණ්ඩව පැවතිය යුතුය.

(2) සාමාජිකයකු මිය ගිය දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් තුළ ඔහුගේ මුදලය, ඔහු මිය ගිය දින පැවති සමිතියේ ණය සම්බන්ධයෙන් බැඳී තිබිය යුතුය.

සාමාජිකයින්ගේ නාමලේඛණය

29. ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන සාමාජිකයන්ගේ නාමලේඛණයක් හෝ ලැයිස්තුවක්, එහි සටහන් කරන ලද පහත සඳහන් විස්තර වලින් යම් විස්තරයක් පිළිබඳව බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් විය යුතුය.

සාමාජිකයකු වශයෙන් :

(i) යම් තැනැත්තකුගේ නම ඒ නාම ලේඛණයෙහි හෝ ලැයිස්තුවෙහි සටහන් කරන ලද දිනය,

(ii) සාමාජික අංකය,

(iii) එබඳු යම් තැනැත්තකු සාමාජිකයකුව සිටීම නතර කළ දිනය,

සමිතියේ පොත්පත් වල සටහන් ඔප්පු කිරීම

30. (1) ලියාපදිංචි කළ සමිතියක් ගණුදෙනු කිරීමේදී විධිමත් ලෙස තබන ලද පොතක වූ යම් සටහනක පිටපතක් රීති වලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් සහතික කරනු ලැබුවේ නම්, ඒ සටහන පැවති බවට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් ලෙස යම් සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයකදී පිළිගත යුතුය. තවද, ඒ මුල් සටහන පිළිගනු ලබන සෑම අවස්ථාවකදී හා පිළිගනු ලබන ප්‍රමාණයකටම, ඒ පිටපතේ සටහන් කරන ලද කරුණු ගණුදෙනු හා ගණන් පිළිබඳ සාක්ෂියක් වශයෙන් පිළිගනු ලැබිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියක් පාර්ශවකරුවකු නොවන යම් නීති කෘත්‍යයකදී, (1) වැනි වගන්තිය යටතේ ඔප්පු කළ හැකි කරුණු අඩංගු සමිතියේ පොත් වලින් යම් පොතක් ඉදිරිපත් කරන ලෙස හෝ එහි සටහන් කරන ලද යම් කරුණු ගනුදෙනු හෝ ගණන් ඔප්පු කිරීම පිණිස සාක්ෂිකරුවකු වශයෙන් පෙනී සිටින ලෙස, අධිකරණය විසින් විශේෂ හේතු කරනකොට ගෙන එසේ කිරීමට විධානය කරතොත් මිස, ඒ සමිතියේ කිසිම නිලධරයකුට බල නොකළ යුතුය.

සමිතියක් විසින් ඔඩපන වශයෙන් සුරැකුම්පත් සංශෝධනය

31. තත් කාලයේ බලපවත්නා ලිඛිත නීතියක් හෝ වෙනත් නීතියක් නොතකා ලියාපදිංචි කළ සමිතියක් විසින්,

(අ) සාමාන්‍ය ගිණුම් තුළනයක් සඳහා ඇපය වශයෙන් ඒ සමිතිය සතු යම් සුරැකුම් පත් ඔඩපන කළ හැකිය තවද,

(ආ) සමිතිය වෙත නිකුත් කරනු ලැබූ දැන්වීමක් අවසන් වන දිනයෙහි මුදල් ගෙවීම නොකරන ලද්දේ නම්, අධිකරණය වෙත නොගොස් ඒ සුරැකුම්පත් වලින් යමක් හෝ ඒ සියල්ලම විකුණා එයින් ලැබෙන මුදල් ඒ ගිණුම තුළනයට බැර කරන ලෙස ණය හිමියාට බලය පැවරිය හැකිය.

දේපළ අත්කර ගැනීමේ හා විකිණීමේ අයිතිය

32. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් එහි පරමාර්ථ වලට සම්බන්ධ යම් කාර්යයක් සඳහා ඉඩම්, ගොඩනැගිලි හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපල මිලට ගැනීමෙන්, තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීමට හා බද්දට ගැනීම හෝ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම කළ හැකිය.

(2) එසේ වුවද වෙළඳ බඩු තොග නොවන වෙනත් යම් චංචල හෝ නිශ්චල දේපලක් විකිණීම, මිලට ගැනීම, තෑගි වශයෙන් ගැනීම බද්දට ගැනීම, කුලියට ගැනීම උකස් ගැනීම හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීමේදී හා විකිණීමේදී බද්දට දීමේදී තෑගි වශයෙන් දීමේදී උකස් කිරීමේදී හා වෙනත් ආකාරයකින් බැහැර කිරීමේදී ඒ සඳහා මහා සභාවේ හා රෙජිස්ට්‍රාර්ගේ පූර්ව අනුමැතිය ද ලබාගත යුතුය. අනුමැතිය ලබාගත යුතු වටිනාකම් සම්බන්ධයෙන් වන සීමාවන් පිළිබඳව රීති පැනවිය හැකි වන්නේය.

ඉඩම් ගොඩනැගිලි අනිවාර්යයෙන් අත්කර ගැනීම

33. (1) ලියාපදිංචි කළ සමිතියක පරමාර්ථවලට සම්බන්ධ කාර්යයක් සඳහා යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය පොදු කාර්යයක් ලෙස සළකනු ලැබිය යුතු අතර, ආණ්ඩුව විසින් ඒ සමිතිය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල අත්කර ගත හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියක් සඳහා ආණ්ඩුව විසින් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගත යුතු අවස්ථාවක, ඒ සමිතිය විසින් ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ඒ පනතේ 38 වෙනි වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබීමට පෙර, ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් ඒ පනත යටතේ නිශ්චය කරනු ලැබූ මුදල හා අත්කර ගැනීමේ කටයුතුවලදී ආණ්ඩුව විසින් දරනු ලබන වියදම් ද, ආණ්ඩුවට ගෙවිය යුතුය. එසේ වුවද, ඒ පනත යටතේ ඒ වන්දි මුදල් නිශ්චය කිරීමට පෙර යම් හදිසි කාර්යයන් හේතුකොට ගෙන යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගැනීම අවශ්‍ය වන අවස්ථාවක, ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් නිශ්චය කරනු ලැබිය හැකි යයි අත්කර ගැනීමේ නිලධාරියා අදහස් කරන යම් මුදලක් ඒ ආඥාව කිරීමට පෙර ඒ සමිතිය විසින් ආණ්ඩුවට ගෙවිය යුතු අතර, ඉතිරි මුදලක් ඇතොත් ඒ ඉතුරු මුදල ඒ පනත යටතේ වන්දි මුදල නිශ්චය කරනු ලැබීමෙන් පසු ගෙවිය යුතුය.

*V වැනි පරිච්ඡේදය*

*මුද්දර ගාස්තුවෙන් හා ගාස්තු වලින් නිදහස්වීම*

මුද්දර ගාස්තුවලින් හා ගාස්තුවලින් නිදහස්වීම

34. (1) ලියාපදිංචි කළ සෑම සමිතියක්ම :

(අ) ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් විසින් හෝ වෙනුවෙන් හෝ ඒ සමිතියේ වාසියට ලියා අත්සන් කරනු ලබන යම් නිත්‍යානුකූල ලේඛණයක් සම්බන්ධයෙන් හෝ මෙම පනතේ 59 වෙනි වගන්තියේ විධි විධාන අනුව අධිකරණයට ඉදිරිපත් කරනු ලබන යම් ලේඛණයක් සම්බන්ධයෙන්, මේ උප වගන්තිය මගින් නිදහස් කිරීම නිසා නොවේ නම්, අය කෙරෙන ගාස්තුව ගෙවීමට ඒ සමිතිය යටත් විය හැකි අවස්ථාවලදී, ඒ නිත්‍යානුකූල ලේඛණය හෝ අත් ලේඛණය සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලැබිය හැකි යම් මුද්දර ගාස්තුවකින් හා,

(ආ) ණය සුරැකුම් පතක් පැවරීම සඳහා ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයක් මේ උප වගන්තිය මගින් නිදහස් කිරීම නිසා නොවේ නම්, අය කෙරෙන ගාස්තුව ගෙවීමට ඒ සමිතිය යටත්විය හැකි අවස්ථාවලදී ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලැබිය හැකි යම් මුද්දර ගාස්තුවකින් හා,

(ඇ) ලේඛණ ලියාපදිංචි කිරීමට අදාළව තත් කාලයෙහි බලපවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් ගාස්තු වලින් නිදහස් විය යුතුය.

(2) ලියාපදිංචි කල සෑම සමිතියක සාමාජිකයෙකු විසින් ඒ ලියාපදිංචි කල සමිතියේ වාසියට ලියා අත්සන් කරනු ලබන යම් නිත්‍යානුකූල ලේඛණයක් සම්බන්ධයෙන් හා ණය සුරැකුම්පතක් පැවරීම සඳහා ලියා අත්සන් කරනු ලබන සාධන පත්‍රයක් සම්බන්ධයෙන් මේ උප වගන්තිය මගින් නිදහස් කිරීම නිසා නොවේ, නම් අයකරන ගාස්තුව ගෙවීමට ඒ සාමාජිකයා යටත් විය හැකි අවස්ථාවලදී ඒ නිත්‍යානුකූල ලේඛනය සම්බන්ධයෙන් හා ඉහතකී සාධන පත්‍රය සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අයකරනු ලැබිය හැකි යම් මුද්දර ගාස්තුවක් ගෙවීමෙන් ඒ සෑම සාමාජිකයෙකුම නිදහස් විය යුතුය.

*VI වැනි පරිච්ඡේදය*

*අතුරු ව්‍යවස්ථාවලට අදාළ සාමාන්‍ය විධිවිධාන*

35. (1) ලියාපදිංචි කළ සෑම සමිතියක සෑම අතුරු ව්‍යවස්ථාවකින්ම එම අතුරු ව්‍යවස්ථාව ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු ඒ සමිතියේ එක් එක් සාමාජිකයා විසින් එම අතුරු ව්‍යවස්ථාව අත්සන් කරන ලද්දේ නම් හා එම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පිළිපැදීමට එක් එක් සාමාජිකයා දුන් පොරොන්දුවක් එම අතුරු ව්‍යවස්ථාවට ඇතුළත් වූයේ නම්, ඒ ප්‍රමාණයට සමිතියද එහි සාමාජිකයින් ද බැඳී සිටිය යුතුය. සමිතියක අතුරු ව්‍යවස්ථා වලින් සාමාජිකයින් බැඳෙන බව.

(2) ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථාවක අර්ථ නිරූපනය සම්බන්ධයෙන් පැන නගින යම් ආරවුලක් තීරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර් වෙත යොමු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය නිත්‍යානුකූළ අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

36. අතුරු ව්‍යවස්ථාව සෑදීමට යම් රීතියකින් බලය පැවරුණු යම් කරුණක් සම්බන්ධයෙන් ලියාපදිංචි කළ සමිතියක් විසින් සාදන ලද කිසිම අතුරු ව්‍යවස්ථාවක්, එය ව්‍යාපාර තහනම් කිරීමේ ගිවිසුමක් යන හේතුව පිට පමණක් කිසිම අධිකරණයක දී ප්‍රශ්ණ නොකළ යුතුය. ව්‍යාපාර තහනම් කෙරෙන අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය.

37. ලියාපදිංචි කළ කිසිම සමිතියක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා වලින් සමිතියේ අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධයෙන් එහි සාමාජිකයින්ට දඩ නියම කිරීම සඳහා යම් රීති වලට යටත්ව විධිවිධාන සැලැස්විය හැකි ය. සාමාජිකයින්ට දඩ නියම කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය

එසේ වුවද

(අ) සමිතියක් විසින් ඒ දඩය නියම කිරීමට අදහස් කරන බව හා ඊට හේතු ඔහු වෙත ලියවිල්ලකින් දැනුම් දී ඇත්නම් මිස හා,

(ආ) රීති වලින් නියම කරනු ලැබිය හැකි කාලායක් තුල හා ආකාරයකින් ඒ දඩය නියම කිරීමට විරුද්ධව ප්‍රමාණවත් හේතු දැක්වීමට ඔහු අපොහොසත්වී ඇත්නම් මිස, කිසිම සාමාජිකයෙකුට ඒ දඩය නියම නො කළ යුතුය.

*VII වැනි පරිච්ඡේදය*

*ලියාපදිංචි කළ සමිතිවල දේපළ සහ අරමුදල්*

38. (1) ලියාපදිංචි කළ සෑම සමිතියක විසින් සාමාජිකයකු නොවන කිසිම තැනැත්තෙකුට යම් ණය මුදලක් නොදිය යුතු ය. එසේ. වුවද, ලියාපදිංචි කළ සමිතියක මහා සභාවේ අනුමැතිය ඇතිව රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව මහා සභාව විසින් නියම කරනු ලබන කොන්දේසි මත, ලියාපදිංචි කළ සමිතියක් විසින් වෙනත් ලියාපදිංචි සමිතියකට ණය ප්‍රදානය කළ හැකි ය. නැතහොත් ආශ්‍රිත සාමාජිකයකුට ණයට බඩු සැපයිය හැකිය. ලියාපදිංචි කළ සමිති වලින් දෙනු ලබන ණය

(2) ස්වකීය මහා සභාවේ අනුමැතිය ඇතිව හැර, ලියාපදිංචි සමිතියක් විසින් කෘෂිකාර්මික නිෂ්පාදන නොවන යම් චංචල දේපළක ඇපය මත මුදල් ණයට දෙනු නොලැබිය යුතුය.

39. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් රීති වලින් හෝ අතුරු ව්‍යවස්ථා වලින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයට හා එසේ නියම කරනු ලැබිය හැකි කොන්දේසි යටතේ පමණක්, සාමාජිකයින් නොවන තැනැත්තන්ගේ තැන්පතු හා ණය මුදල් භාර ගත යුතුය. ලියාපදිංචි සමිතියක් විසින් භාරගනු ලබන තැන්පතු හා ණය.

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් චංචල හෝ නිශ්චල දේපළක උකස පිට බැංකුවක් විසින් ණය මුදල් දෙන ලද අවස්ථාවක ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ

ඒ උකස ලියාපදිංචි කිරීමේ දිනයට පෙර, එම ආඥා පනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද්දාවූ ද, එම දේපල බලපාන්නාවූ ද, උකසක් හෝ එසේ ලියාපදිංචි කරන ලද උකසකින් ආරක්ෂිත එසේ බලපාන්නාවූ ගෙවීමට බැඳී සිටීමක් හැර, එම දේපළට බලපාන්නාවූ ඒ ලියාපදිංචි කරන ලද සමිතියේ කවරවූ හෝ අන් සෑම ණයකට හෝ එසේ බලපාන්නාවූ සෑම උකසකට හෝ ගෙවීමකට බැඳි සිටීමකට ඉහලින් ප්‍රමුඛත්වය ඇතිව, ඒ උකස ලියාපදිංචි කිරීමේ දිනයේ සිට ඉන් පසු ඒ උකස යටතේ වූ මුදල් ගෙවීමට ඒ දේපල බැඳී තිබිය යුතු ය.

සාමාජිකයක් නොවන තැනැත්තන් සමග කරනු ලබන වෙනත් ගනුදෙනු සීමා කිරීම.

40. ලියාපදිංචි කළ සමිතියක් විසින් සාමාජිකයින් නොවන තැනැත්තන් සමග කරනු ලබන ගණුදෙනු 38 සහ 39 වෙනි වගන්තිවල විධිවිධාන සළසා ඇති පරිදි සිදුවිය යුතු ය.

සමිතියේ අරමුදල් ආයෝජන කිරීම.

41. ලියාපදිංචි කළ සමිතියක් විසින් භාර ආඥා පනතේ, 20වැනි වගන්තියෙන් නිශ්චිතව සඳහන් නිශ්චන දේපලක් පිළිබඳ පළමු උකසක් නොවන යම් සුරැකුම් පත් වල හෝ භාණ්ඩාගාර බිල්පත්වල හෝ රෙජිස්ට්‍රාර් විසින් මේ කාර්යය සඳහා අනුමත කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද රාජ්‍ය බැංකුවක හෝ අවම වශයෙන් ආයෝජනය කළ හැකි මුදලින් සියයට පනහක් වත් සහ ඉතිරිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත වෙනත් මූල්‍ය ආයතනයක හෝ බැංකුවක හෝ රෙජිස්ට්‍රාර් විසීන් මේ කාර්යය සඳහා අනුමත කරන ලද වෙන යම් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක කොටස් වලට හෝ ඇප පිට හෝ රීති වලින් අවසර දෙන ලද වෙන යම් ආකාරයකින් සමිතියේ අරමුදල් තැන්පත් කිරීම හෝ ආයෝජනය කිරීම කළ හැකි ය.

ලාභ පිළිබඳ සුදුස්සක් කිරීම

42. (1) ලියාපදිංචිකළ සෑම සමිතියක් විසින් 44 වැනි වග්නතිය යටතේ විගණක විසින් නිශ්වය කරනු ලබන පරිදි යම් මුදල් වර්ෂයක් තුළ එහි වූ ශුද්ධ ලාභ වලින්,

(අ) ඒ ශුද්ධ ලාබ වලින් 25%කට නොඅඩු යම් මුදලක් සමිතියේ නිදන් අරමුදලට මාරු කළ යුතුය, එමේන්ම ;

(ආ) ශුද්ධ ලාභයෙන් 10%ක් හෝ රුපියල් 50,000ක් යන දෙකෙන් අඩු ප්‍රමාණය සමුපකාර අරමුදලට සෑම සමිතියක් විසින්ම ගෙවිය යුතුය යම් සමුපකාර සමිතියක් පාඩු ලැබුවද රු. 500/- සමුපකාර අරමුදලට ගෙවිය යුතුය එතෙකුදු වුවත් පාසැල් සමුපකාර සමිතිවලට මෙය බලනොපැවැත් විය යුතුය මෙම අරමුදල් පාලනය කිරීම සඳහා රීති මගින් විධිවිධාන සැළැස්විය යුතුය ;

(ඇ) ගෙවා නිම් කොටස් ප්‍රාග්ධනය සඳහා 10% කට අධික නොවන පරිදි ලාභාංශ වශයෙන් වෙන් කිරීම.

(2) ඉතිරි ලාභයන් පහත සඳහන් කාර්යයන් සියල්ලම හෝ ඉන්යමක් සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය හැකිය.

(අ) සාමාජිකයින් විසින් සමිතිය සමග කරන ලද ගණුදෙනු වල වටිනාකම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා වල නියමිත ප්‍රමාණයට හා ආකාරයකින් ඔවුන්ට ප්‍රතිදාන ගෙවීම

(ආ) අතුරු ව්‍යවස්ථා වල නියම කරනු ලැබිය හැකි යම් අරමුදල් වලට දායක මුදල් ගෙවීම;

(ඇ) සමුපකාර සේවක කොමිෂන් සභා නියමයන් අනුව සමිතියේ සේවකයින්ට ප්‍රසාද මුදල් ගෙවීම;

(ඈ) අතුරු ව්‍යවස්ථාවල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අන් කිසිවකුට කරනු ලබන ගෙවීම් ;

(ඉ) යම් සමාජයීය, සංස්කෘතික හෝ විනෝද කාර්යයන් පිණිස හෝ ප්‍රාදේශීය හෝ මහජන සුභ සිද්ධිය සඳහා වූ වෙන යම් අරමුණක් සඵල කිරීම පිණිස පොදු සුභ සාධක අරමුදලට ශුද්ධ ලාභ වලින් 10%කට නොවැඩි යම් මුදලක් ගෙවීම,

(3) ලියාපදිංචි කරනු ලබන සමුපකාර සමිතියක්, රෙජිස්ට්‍රාර්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක් නොමැතිව කිසිම ලාභ බෙදීමක් නො කළ යුතුය.

*VIII වැනි පරිච්ඡේදය*

*ලියාපදිංචි සමිතියක අයවැය, විගණනය, විභාගය, පරීක්ෂණය හා විමර්ශනය*

සමිතියේ ගිණුම් හා අයවැය පිළියෙල කිරීම

43. (1) (අ) සෑම ලියාපදිංචි සමිතියක්ම ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් ගනුදෙනු පිළිබඳ, රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන ප්‍රමිතීන්ට අනුව, නිසි ගිණුම් පවත්වා ගෙන යාමට සැළැස්විය යුතුය ;

(ආ) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලද යම් තැනැත්තකු විසින් නියම කරනු ලබන පරිදි, සමිතියේ කටයුතු වලට අදාල ගිණුම් හා සංඛ්‍යාත පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්ෂික අවසාන ගිණුම් හා ශේෂ පත්‍රයක් සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම සකස් කරනු ලැබිය යුතුය. එය අදාල මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුලත, රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තකු වෙත ඉදිරිපත් කළ යුතුය ;

(ඇ) මේ වගන්තියේ විධිවිධාන වලින් කිසිවක් අනුව කටයුතු කිරීම ලියාපදිංචි කළ සමිතියක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ සමිතියේ කාරක සභාවේ සෑම සාමාජිකයකු මෙන්ම, එම කාර්යය පැවරුනු සෑම නිලධාරියෙකුම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් 2000 (දෙදහසක් ) නොඉක්මවන දඩයකට ඔහු යටත්විය යුතුය ;

එසේ වුවද, වරද කරනු ලැබුවේ තමාගේ අනුදැනුම නොමැතිව බව හා ඒ වරද කිරීම වැළක්වීමට නිසි සියළු උද්යෝගයෙන් තමා සෑම විටම ක්‍රියා කළ බව ඒ සාමාජිකයා හෝ නිලධාරියා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු ඒ වරදට වරදකරු නොවන්නේ ය.

(2) (අ) සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම ආදායම් ඉලක්ක, පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්, මූල්‍ය හා මුදල් සම්පත්, මුදල් ආයෝජන, අයවැය ගත කරන ලද ලාභ අලාභ ගිණුම, ආදායම් හා වියදම් ගිණුම සහ ශේෂ පත්‍රය දැක්වෙන අයවැය ලේඛනයක් සෑම මුදල් වර්ෂයක් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබිය යුතුය ; ශේෂ පිරික්සුම වෙළඳ, ලාභඅලාභ ගිණුම් හා ශේෂ පත්‍රය

(ආ) ඒ අයවැය ලේඛණය අදාළ වන මුදල් වර්ෂය ආරම්භවීමට පෙරාතුව වූ මාස දෙකකට කලින්, එය අනුමැතිය සඳහා සමිතියේ මහා සභාව වෙත ඉදිරිපත් කළ යුතුය ;

(ඇ) එම අයවැය ලේඛණය අදාළ වන මුදල් වර්ෂය ආරම්භ වීමට පෙරාතුව වූ මාසයකට කලින්, ඒ අයවැය ලේඛණයේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතුය ;

(ඈ) එම අයවැය ලේඛණය පිළියෙල කරනු ලැබිය යුතු ආකෘතිය සහ ආකාරයද, එහි අඩංගුවිය යුතු අවම තොරතුරු ද රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරුන ලබන පරිදි විය යුතුය.

44 (1) සෑම අවුරුද්දකට වරක්වත් සෑම ලියාපදිංචි කරනු ලැබූ සමිතියකම ගණන් රෙජිස්ට්‍රාර්වරයා විසින් විගණනය කිරීමට හෝ ඒ වෙනුවෙන් ලියවිල්ලකින් වූ සාමාන්‍ය වූ හෝ විශේෂ නියෝගයක් මාර්ගයෙන්, ඔහු විසින් බලය පවරනු ලබන යම් තැනැත්තකු ලවා විගණනය කරවීම කළ යුතුය. විගණනය

(2) (1) 1 වන උප වගන්තිය යටතේ වූ විගණනයෙහි,

(අ) කාලය ඉකුත් වූ ණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ;

(ආ) ලියාපදිංචි සමිතිවල වත්කම් හා බැරකම් පිළිබඳ තක්සේරුව හා සත්‍යාක්ෂණයක් ;

(ඇ) නිසි මුදල් පාලනය හා සමිතියේ කටයුතු සම්බන්ධයෙන් අඛණ්ඩ ඇගැයීමක් කිරීමට හැකි වනු පිණිස තොරතුරු ඉදිරිපත් කිරීම සහතික කිරීමට සංවිධාන ක්‍රම, කාර්ය පරිපාටි , පොත්, වාර්තා සහ වෙනත් ලිපි ලේඛණ නිසි ලෙස හා ප්‍රමාණවත් ලෙස සැළසුම් කර ඇත්තේ ද සහ ඒ ක්‍රම, කාර්ය පරිපාටි, පොත්, වාර්තා හා වෙනත් ලේඛණ පළදායක ලෙස ක්‍රියාත්මක වන්නේ ද පිළිබඳ පරීක්ෂණයක් ;

(ඈ) සමිති පවත්වා ගෙන යාම මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද රීති නියෝග හෝ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලට අනුකූල වන්නේ ද, සමිතියේ කටයුතු පරිපාලනය කිරීම ඒ පනතේ රීති වල නියෝගවල හෝ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුව කර ඇත්තේ ද යන්න පිළිබඳ පරීක්ෂණයක් ;

(ඉ) අරමුදල් උපයෝගී කිරීම කාර්යක්ෂම ලෙස පරිමැසුම් සහිතව ක්‍රියාත්මක කොට ඇත්තේ ද යන්න පිළිබඳව පරීක්ෂණයක් ;

(ඊ) ලියාපදිංචි සමිතියට අයත් සහ එහි පාලනය යටතේ ඇති මුදල් සහ දේපලවල ආරක්ෂාව සහතික කරනු පිණිස සතුටුදායක කාර්ය පරිපාටියක් සකස් කොට ඇත්තේද යන්න පිළිබඳ පරීක්ෂණයක් ;

(උ) ගිණුම්, මුදල් යෙදවීම හා තක්සේරු කිරීම සම්බන්ධයෙන් වූ සිද්ධාන්ත කෙරෙහි නිසි අවධානය ඇතිව සැලකිල්ලට භාජනය කොට ඇති කාල සීමාව සම්බන්ධයෙන් සමිතියේ කටයුතු පිළිබඳව සත්‍ය වූ සහ නිවැරදි ගිණුම් ඉදිරිපත් කිරීම පිණිස විගණනය කරනු ලැබූ ගිණුම් සැළසුම් කොට ඇත්තේ ද යන්න පිළිබඳ පරීක්ෂණයක් සහ ;

(ඌ) වෙනත් නියමිත කරුණු ඇතුළත් විය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ විගණනයක කාර්යයන් සඳහා රෙජිස්ට්‍රාර්ට හෝ ගණන් විගණනය කිරීම පිණිස ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට ;

(අ) රෙජිස්ට්‍රාර්ගේ හෝ විගණනය සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ මතය අනුව සමිතියේ යම් ගණුදෙනු හෝ එහි කටයුතු පිළිබඳ කළමණාකාරිත්වය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු සැපයිය හැකි සමිතියේ යම් අතීත හෝ වර්තමාන යම් නිලධාරියකු-හෝ වෙනයම් තැනැත්තකු කැඳවීම ;

(ආ) සමිතියේ කටයුතු වලට අදාල යම් පොතක් හෝ ලේඛණයක් සමිතියට අයත් යම් මුදලක්, සුරැකුම් පතක් හෝ වෙනත් දේපලක් ඉදිරිපත් කරන, ලෙස එය සන්තකව හෝ භාරව සිටි හෝ සිටින සමිතියේ නිලධාරියකුට නියෝජිතයකුට හෝ සේවකයකුට හෝ සාමාජිකයකුට හෝ වෙන යම් තැනැත්තකුට නියම කිරීමේ හා ;

(ඇ) ඒ විගණනයේදී තමා විසින් වංචාවක් සොයා ගනු ලබන අවස්ථාවක සමිතියේ ගණන් පොත් හෝ ලේඛණ තම භාරයට ගැනීමට බලය තිබිය යුතුය.

4. රෙජිස්ට්‍රාර්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් තත් කාලය සඳහා සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වා ගෙන යනු ලබන සියළු පොත්, ලේඛණ, ගිණුම් සහ ලියවිලි, සුරැකුම් පත් හා අතේ ඇති මුදල් සියළු අවස්ථාවල දී ලබා ගැනීමට ද, පරීක්ෂා කිරීමට ද හිමිකම් තිබිය යුතුය. තවද ඉහත කී දේ භාරව සිටින හෝ පවත්වා ගෙන යන හෝ සන්තකයේ ඇතිව සිටින සෑම තැනැත්තකුම ඒවා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඒ සඳහා බලය දෙන ලද තැනැත්තාට ඉදිරිපත් කළ යුතුය. නැතහොත් සමිතියේ ගණුදෙනු හා වැඩ කටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා හෝ විගණනය කරන, ඒ සඳහා බලය දෙන ලද තැනැත්තා විසින් නියම කරනු ලබන තොරතුරු සැපයිය යුතුය.

5. රෙජිස්ට්‍රාර් සහ ලියාපදිංචි කළ සමිතියක ගණන් විගණනය කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ සෑම තැනැත්තකුම, දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව, රාජ්‍ය සේවකයන් ලෙස සළකනු ලැබිය යුතුය.

6. (අ) සමිතියක, සංවිධානය හෝ කළමණාකාරීත්වය භාරව සිටින හෝ භාරව සිටි හෝ සමිතියක නිලධාරියකුව හෝ සේවකයකුව සිටින, කවර හෝ අවස්ථාවක සිට යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ පනවනු ලැබූ රීති වල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද සමුපකාර සමිතිවල මුදල් කාර්ය පරිපාටිය අදාළ රීතිවල නැතහොත් නියෝගවල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද පොදු විධිවිධාන කිසිවක් හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල හෝ සමිතියේ කාරක රීතිවල විධානයන්ට පටහැනිව යම් ගෙවීමක් කර ඇති බව හෝ සමිතියේ අරමුදල් පාවිච්චි කර ඇති බව (1) වැනි උපවගන්තිය යටතේ වූ විගණනයක් පැවැත්වෙද්දී හෝ එය අවසානයේ දී සොයාගත හොත්, රෙජිස්ට්‍රාර් විසින් එවැනි සෑම ගෙවීමකට හා එවැනි සෑම අරමුදල් පාවිච්චි කිරීමකට ඉඩ නොදිය යුතු අතර එවැනි සෑම නීති විරෝධී ගෙවීම් හෝ අරමුදල් පාවිච්චි කිරීම් කළ හෝ කරන හෝ කිරීමට බලය දුන් තැනැත්තාට එය අධිභාර කළ යුතුය. තවද, ඒ තැනැත්තාගේ නොසැලකිල්ල විෂමාචාරය හේතුකොට ගෙන දරන්නට සිදුවූ යම් ඌණතාවයක් හෝ පාඩුවක් ඒ තැනැත්තා විසින් ගණන් දැක්විය යුතු නමුත්, එසේ ගණන් නොදක්වන ලද යම් මුදලක් ඒ තැනැත්තාගෙන් අයකර ගත යුතුය.

(ආ) යම් තැනැත්තකුට යම් ඉඩදීමක් නොකිරීමට හෝ යම් අධිභාරයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර් විසින් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් සුදුසු යැයි සිතිය හැකි යම් කරුණු සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට හෝ යම් කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට ඔහු විසින් අවස්ථාවක් දිය යුතු අතර, එවැනි ඉඩ නොදීමක් හෝ අධිභාර කිරීමක් කරනු ලැබුවහොත්, රෙජිස්ට්‍රාර්ගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ තීරණය සඳහා හේතු ඉල්ලා ඔහු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු, ඒ ඉඩ නොදීම හෝ අධිභාර කිරීම සම්බන්ධයෙන් තම තීරණයට හේතු ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත සැපයිය යුතුය.

(ඇ) රෙජිස්ට්‍රාර් විසින් කරන ලද තීරණයට අනුකූලව ක්‍රියා නොකරන ලද අවස්ථාවක, 66(2) වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

45. (1) ලියාපදිංචි කළ සමිතියක ක්‍රියාකාරිත්වයෙහි යම් අඩුපාඩු 44 වන වගන්තිය යටතේ කරන ලද විගණනයකදී හෙළිදරව් වුවහොත්, රෙජිස්ට්‍රාර් විසින් ඒ අඩුපාඩු සමිතියේ දැනගැනීමට හා ඒ සමිතිය අන් සමිතියක සාමාජිකයකු නම් ඒ අන් සමිතියේ දැන ගැනීමට සැලැස්විය යුතුය. විගණනයෙහි අඩුපාඩු සමිති වෙත දැන්වීම

(2) රෙජිස්ට්‍රාර් විසින්, හෙළිදරව් වූ අඩුපාඩු සම්බන්ධයෙන් පිළියම් යෙදීම සඳහා නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පියවරක් ඒ නියෝගයෙහි සඳහන් කාලය ඇතුළත දී ගන්නා ලෙසට සමිතියට හෝ එහි නිලධරයන්ට විධාන කෙරෙන නියෝගයක් කළ හැකිය ;

(3) විගණන වාර්තාව හා හෙළිදරව් වන අඩුපාඩු සමිතියේ මහා සභාවට ඉදිරිපත් කරන ලෙස රෙජිස්ට්‍රාර් විසින් නියෝග කරනු ලැබිය යුතුය.

46. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් තම මෙහෙයවීමෙන්ම ලියාපදිංචි සමිතියේ සංයුතිය ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකිය. තවද කාරක සභාවේ බහුතරයක ඉල්ලීම මත හෝ ලියාපදිංචි සමිතියක සාමාජිකයින්ගෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජිකයින් සංඛ්‍යාවකගේ ඉල්ලීම මත ලියා පදිංචි සමිතියක සංයුතිය ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වනු ලැබිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්ය සඳහා ලිඛිත නියමයක් මගින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට ලියාපදිංචි සමිතියේ සංයුතිය ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට විධාන කළ හැකි ය. විභාගය

(2) (1) වන උපවගන්තිය යටතේ විභාගයක් පැවැත්වීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හෝ විභාගයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට-

(අ) රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ විභාග කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ මතය අනුව සමිතියේ යම් ගනුදෙනුවක් හෝ එහි කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු සැපයිය හැකි සමිතියේ කලින් සිටි හෝ දැනට සිටින නිලධරයකු, නියෝජිතයකු සේවකයෙකු හෝ සාමාජිකයකු හෝ වෙනයම් තැනැත්තෙකු කැඳවීමට ;

(ආ) කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ යම් නිලධරයෙකු නියෝජිතයෙකු සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකුට සමිතියේ කටයුතුවලට අදාල යම් පොතක් හෝ ලේඛනයක් හෝ සමිතියට අයත් යම් මුදල් ඇප හෝ වෙනත් දේපල ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ;

(ඇ) තමා විසින් යොමුකරනු ලබන යම් කාරණා තීරණය කිරීම පිණිස තමා විසින් සඳහන් කරනු ලබන යම් වේලාවක සහ ස්ථානයක දී සමිතියේ සාමාජිකයින්ගේ මහ සභා රැස්වීමක් කැඳවීමට ; සහ

(ඈ) ඒ විභාගය හෝ පරීක්ෂණය අතරතුර වංචාවක් හෝ අක්‍රමිකතාවයක් ඇති බව විශ්වාස කිරීමට තමාට හේතු ඇති අවස්ථාවක සමිතියේ ගිණුම් පොත් හෝ ලේඛණ තම භාරයට ගැනීමට බලය ඇත්තේය.

(3) රෙජස්ට්‍රාර්වරයා සහ මේ වගන්තිය යටතේ විභාගයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බලය දෙනු ලැබූ සෑම තැනැත්තෙකුම දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයින් ලෙස සලකනු ලැබිය යුතුය.

47. රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකු ලවා යම් ලියාපදිංචි සමුපකාර සමිතියක පොත්පත් දේපල ගිණුම් හෝ වෙන ඕනෑම දෙයක් හෝ දේවල් පරීක්ෂා කිරීමට බලය ඇතිවන අතර එසේ පරීක්ෂාකරන නිලධාරීන්ට මෙම ප්‍රඥප්තියේ 46(11) (111) උප වගන්තිය යටතේ සඳහන් සියලුම බලතල ලැබිය යුතුය.

එවැනි පරීක්ෂණයකින් හෙළිවන තොරතුරු සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයටත් සමිතියේ මහ සභාවටත් අවස්ථාවෝචිත පරිදි දැන්විය හැකි අතර ඒ සඳහා වූ යම් නියෝගයක්ද කළහැකි වන්නේය.

*IX වැනි පරිච්ඡේදය*

*ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව අත්හිටුවීම, ඉවත් කිරීම, විසුරුවා හැරීම හා පුරප්පාඩු පිරවීම සහ සේවා නියුක්තයන් සම්බන්ධ කටයුතු*

සමිතියක කාරක සභාව විසුරුවා හැරීම.

48 (1) 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ පරීක්ෂණයකින් හෝ පසු ලියාපදිංචි කළ යම් සමිතියක කාරක සභාව විසින් ස්වකීය කාර්යයන් නිසි ආකාරයෙන් ඉටු නොකරන බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම් එම කාරක සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් කාරක සභාවේ හෝ කාරක සභිකයින්ගේ යම් විරෝධතා ඇතොත්, එම විරෝධතා දැක්වීමට ඔහු විසින් අවස්ථාවක් දීමෙන් පසුව, 46 වැනි වගන්තිය යටතේ වූ ඒ විභාගය හෝ පරීක්ෂණය හෝ ඔහුගේ මෙහෙයවීමෙන්ම පවත්වනු ලැබුවේ නම්, රීතිවලට අනුකූලව ඔහු විසින් කැඳවනු ලැබූ මහා සභාවට ද ඒ විභාගය කාරක සභාවේ බහුතරයක ඉල්ලීම් මත හෝ සාමාජික සංඛ්‍යාවෙන් හෝ මහා සභා නියෝජිත සංඛ්‍යාවෙන් 1/3 කට නොඅඩු සංඛ්‍යාවකගේ ඉල්ලීම මත පවත්වනු ලැබුවේ නම් අතුරු ව්‍යවස්ථානුකූලව මහා සභා රැස්වීමක් කැඳවීමට අපොහොසත් වූ විටෙක හෝ කැඳවනු නොලබන විටෙක රෙජිස්ට්‍රාර්වරයා විසින් රීතිවලට අනුකූලව කැඳවනු ලැබූ මහා සභා රැස්වීමට ද ඔහුගේ තීරණ වාර්තා කළ යුතු අතර මහා සභාව විසින්,

(අ) වරද කරන ලද කාරක සභිකයා හෝ සභිකයින් ඉවත් කළ හැකි අතර, එහි ප්‍රතිඵලය වශයෙන් ඇති වන පුරප්පාඩු අතුරු ව්‍යවස්ථානුකූලව පුරවනු ලැබිය හැකි ය ;

(ආ) කාරක සභාව විසුරුවා හැර අළුත් කාරක සභාවක් තෝරා පත්කර ගනු ලැබිය හැකි ය.

(2) (අ) රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය පරිදි මහා සභාව විසින් කටයුතු නොකරන විට හෝ එසේ මහා සභාව විසින් කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන විට හෝ මහා සභාව විසින් ඒ පිළිබඳව තීරණයක් නොගන්නා විටකදී හෝ ඒ පිළිබඳව තීරණයක් ගැනීමට මැලිවන විටකදී හෝ තීරණයක් ගැනීම කල් ගතවන විටකදී හෝ එම තීරණයට සංශෝධන ඉදිරිපත් කරන විටකදී හෝ ඒ පිළිබඳව මහා සභාවේ අදහස් ද සළකා බලා, තවදුරටත් එම කරුණ පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් නොවන්නේ නම් හා සමිතියේ මහා සභාව නිසි පරිදි සංස්ථාපනය වී නොමැති විටෙක 48(1) වගන්තිය යටතේ කටයුතු කිරීමට අපහසු අවස්ථාවක හෝ වැරදි කර ඇති කාරක සභිකයින් ඉවත් කිරීම හෝ කාරක සභාව විසුරුවා හැරීම හෝ ලියවිල්ලකින් වූ නියෝගයකින් කළ හැකිය.

(ආ) එසේ කාරක සභාව විසුරුවා හැරීමෙන් පසු ඒ සමිතියේ කටයුතු කළමණාකරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් රාජ්‍ය නිලධාරීන් තුන් දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් පත්කළ යුතුය. යටත් පිරිසෙයින් ඉන් එක් අයෙකුවත් සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු විය යුතුය. එසේ පත් කරනු ලබන තැනැත්තන් රීති මාලාවේ සඳහන් නුසුදුසුකම්වලින් නොපෙලෙන්නන් විය යුතුය. මෙම රාජ්‍ය නිලධාරීන් සමුපකාර ව්‍යාපාරය පිළිබඳ දැනුමක් ඇති, අදාළ සමිතියේ ව්‍යාපාරික අරමුණු පිළිබඳ විශේෂ දැනුමක් ඇති අය විය යුතුය.

ඉහත 48 (1) (ආ) සහ (2) (ආ) වගන්ති යටතේ තෝරා පත්කරනු ලැබූ කාරක සභාව හෝ තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලය මාස 06 ක කාලයක් සඳහා පත්කළ හැකිය. එසේ වුවද අධිකරණයට කරුණු යොමු වී ඇති අවස්ථාවක දී තීන්දුවක් ලැබෙනතෙක් ඉහත කී පාලක මණ්ඩලය තවදුරටත් වලංගු වන්නේ ය.

(ඇ) ඉහත (ආ) වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා පත්කරන මණ්ඩලයේ නිල කාලය මාස හයකට වැඩි නොවිය යුතුය. එසේකුදු වුවත් සමිතියේ මහ සභාවේ යෝජනා සම්මතයකින් පාලක මණ්ඩලයේ කාලය යම් කාල සීමාවක් සඳහා දීර්ඝ කළ යුතු යැයි ඉල්ලා සිටින අවස්ථාවක පාලක මණ්ඩලයේ කාලය රෙජිස්ට්‍රාර්වරයාට දීර්ඝ කළ හැකි වන්නේ ය.

(3) (අ) යම් සමුපකාර සමිතියක කාරක සභාවක් නොමැති අවස්ථාවක හෝ අක්‍රිය වූ අවස්ථාවක, එම සමිතිය යථා පරිදි ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා යටත් පිරිසෙයින් එක් අයෙකුවත් දෙපාර්තමේන්තු නිලධාරිවරයෙකුගෙන් සමන්විත තිදෙනෙකුගෙන් යුත් පාලක මණ්ඩලයක් පත් කිරීම අවශ්‍යයැයි රෙජිස්ට්‍රාර්වරයාට හැඟී යන්නේ නම්, එවැනි අවස්ථාවක එකී සමිතිය සඳහා තිදෙනකුගෙන් යුත් පාලක මණ්ඩලයක් පත් කිරීමේ බලය රෙජිස්ට්‍රාර්වරයා සතු වන්නේ ය. එසේ පත් කරනු ලබන කළමනාකරණ මණ්ඩලයේ උපරිම කාලය වර්ෂයකට වඩා නොවැඩි විය යුතුය.

(ආ) 2(ආ) සහ 2(ඈ) වගන්ති යටතේ පත් කරනු ලැබූ පාලක මණ්ඩලය විසින් සමිතියේ යථා පරිදි පත් කරන ලද කාරක සභාවට හිමි සියලුම බලතල හා අයිතිවාසිකම් සහ වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකි ය. එසේ වුවද, රෙජිස්ට්‍රාර්වරයා විසින් විශේෂ නියෝගයකින් ඉඩ දෙනු ලබන අවස්ථාවකදී පමණක්, ඔවුන්ට මහා සභා බලතල ද හිමිවේ.

(ඇ) (2) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ හා 3 (අ) උපවගන්තිය යටතේ පත් කරන ලද පාලක මණ්ඩලයකට මේ ප්‍රඥප්තියට, රීති මාලාවට හෝ අතුරු ව්‍යවස්ථාවට පටහැනිව. හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ නියෝගවලට පටහැනිව, ඔවුන් විසින් සිදු කරන ලද යම් ක්‍රියා මගින් ඇති කරන ලද යම් පාඩු සඳහා එක්ව සහ වෙන් වෙන්ව වගකිව යුතුය.

(ඈ) සමිතියේ කටයුතු කළමණාකරණය කිරීමට හා (2) වන උපවගන්තියේ (ආ) (ඇ) ඡේදයන් හා 3 (අ) උප වගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තකුට ගෙවිය යුතු පාරිශ්‍රමිකය මහා සභාව විසින් හා රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය. එම පාරිශ්‍රමික මුදල් සහ සමිතියේ කටයුතු කළමනාකරණය කිරීමේ දී දරන්නට සිදු වූ වෙනත් වියදමක් වෙතොත් ඒවාද, සමිති අරමුදලින් ගෙවිය යුතු ය.

(ඉ) ලියාපදිංචි සමිතියක කටයුතු කළමණාකරණය කිරීම සඳහා (2) (ආ) (ඇ) සහ (3) (අ) උප වගන්ති යටතේ පත් කරන ලද පාලක මණ්ඩලය විසින් තම ධූර කාලය අවසන් වීමට පෙර, සමිතියේ අතුරු ව්‍යවස්ථානුකූලව අළුත් කාරක සභාවක් තෝරා පත්කිරීම සඳහා කටයුතු කළ යුතුය.

(4) 49 වන වගන්තිය යටතේ සමිතියේ ලියාපදිංචිය අවලංගු කිරීමට රෙජිස්ට්‍රාර්වරයාගේ බලය කෙරෙහි මේ වගන්තියේ කිසිවකින් බලපෑමක් ඇති කරවන්නේ යැයි සළකනු නොලැබිය යුතු ය.

(5) 46 වන වගන්තිය යටතේ විභාගයක් හෝ පරීක්ෂණයක් නිම කිරීමට පෙර, කාරක සභාවට විරුද්ධව මුල් බැල්මට හෝ චෝදනාවක් තහවුරුවී ඇතැයි රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වේ නම් ඒ කාරක සභාව මාස 06ක කාල සීමාවක් සඳහා අත්හිටුවීමට ද, සමිතියේ වැඩ කටයුතු කළමණාකරණය කිරීම සහ පරිපාලනය කිරීම පිණිස යටත් පිරිසෙයින් දෙපාර්තමේන්තුවේ එක් නිලධාරියෙකුවත් ඇතුළත් අන්තර් කාලීන මණ්ඩලයක් පත්කිරීමට ද, ඔහුට බලය තිබිය යුතුය. ඒ කාරක සභාව අත්හිටුවනු ලැබූ දින සිට මාස 06ක කාල සීමාවක් ඇතුළත, ඒ විභාගය හෝ පරීක්ෂණය රෙජිස්ට්‍රාර්වරයා විසින් නිම කළ යුතු අතර, කාරක සභාව 48(1) (අ) හා 48(2)(ආ) වගන්ති යටතේ විසුරුවා හැරීම සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගනු ලැබිය යුතු ය.

(6) 46 වන වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ පරීක්ෂණයකින් හෝ පසුව, යම් ලියාපදිංචි කළ සමිතියක යම් සේවා නියුක්තිකයකු, තම කාර්යය නිසි ආකාරයෙන් ඉටු නොකරන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්යය ඉටු කිරීමට නුසුදුසු බව නැතහොත්, අන්‍යාකාරයකින් නොහැකිබව, රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වුවහොත්, 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව එම සේවා නියුක්තිකයා සම්බන්ධව විනයානුකූලව කටයුතු කරන ලෙස, අදාළ සමිතියේ කාරක සභාවට රෙජිස්ට්‍රාර්වරයා විසින් නියෝග කළ හැකි ය.

නිලධරයන්ගේ සේවය අත්හිටුවීම හෝ වැඩ තහනම් කිරීම හා නිලධරයන් ඉවත් කිරීම යනාදිය

(7) 46 වන වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ පරීක්ෂණයකින් හෝ පසුව, සොයා ගනු ලබන කරුණු සළකා බැලීමෙන් පසුව, රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ සමිතියේ මහා සභාව විසින් හෝ ඉවත් කරන ලද ලියාපදිංචි කළ සමිතියක කාරක සභිකයකු හෝ කාරක සභිකයින්, එසේ ඔවුන් ඉවත් කරනු ලැබූ දින සිට වර්ෂ හතක් ගතවන තෙක් ලියාපදිංචි කළ කිසිදු සමුපකාර සමිතියක නිලයකට පත්කරනු ලැබීමට නුසුදුස්සන් විය යුතුය.

(8) 46 වන වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ පරීක්ෂණයකින් හෝ පසුව, එම විභාග පරීක්ෂණ කාලය තුල ධූර දරා ඇති කාරක සභිකයකු ස්වකීය කාර්යය නිසි ආකාරයෙන් ඉටු නොකළ බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, ඒ සම්බන්ධයෙන් විරෝධතා දැක්වීමට එකී තැනැත්තාට අවස්ථාවක් දීමෙන් පසුව, ඔහු තවදුරටත් වරදකරු යැයි රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, ඔහු එම වරදට වරදකරු බව ලියවිල්ලකින් දැනුම්දීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇති අතර, අදාල දැනුම්දීමේ දින සිට වර්ෂ හතක් ගතවනතෙක් ලියාපදිංචි කළ කිසිදු සමුපකාර සමිතියක නිලයකට පත්කරනු ලැබීමට නුසුදුස්සන් විය යුතුය.

(9) සබරගමු පළාතේ රෙජිස්ට්‍රාර්වරයාට එම පළාත තුල ලියාපදිංචි කරන ලද කිසිම සමුපකාර සමිතියක, සභාපතිවරයකු ලෙස හෝ අධ්‍යක්ෂවරයකු ලෙස තෝරා පත්වීමට හෝ නම් කරනු ලැබීමට රෙජිස්ට්‍රාර්වරයාට නොහැකි විය යුතු ය.

*X වැනි පරිච්ඡේදය*

*ලියාපදිංචි කළ සමිතියක් විසුරුවා හැරීම*

විසුරුවා හැරීම.

49. (1) 46 වන වගන්තිය යටතේ විභාගයකින් හෝ පරීක්ෂණයකින් පසු ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයින්ගෙන් 3/4 ක කොටසක් විසින් එය විසුරුවා හැරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ලැබීමෙන් පසු හා තම විරෝධතා ඉදිරිපත් කිරීමට සමිතියක සහ ඒ සමිතියේ ණය හිමියන්ට අවස්ථාවක් ලබාදීමෙන් පසු, ඒ සමිතිය විසුරුවා හැරිය යුතු යැයි රෙජිස්ට්‍රාර්වරයා මතය වන්නේ නම්, ඔහු විසින් තම අත්සන යටතේ වූ නියෝගයක් මගින් ඒ සමිතියේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) ලියාපදිංචි කළ සමිතියක යම් සාමාජිකයෙකු විසින් හෝ යම් ණය හිමියකු විසින් (1) වැනි උපවගන්තිය යටතේ වූ නියෝගයක දිනයේ සිට මාස දෙකක් ඇතුළත, ඒ නියෝගයට විරුද්ධව අමාත්‍යවරයා වෙත ආයාචනා කළ හැකිය.

(3) සමිතියක ලියාපදිංචිය අවලංගු කරමින් නියෝගයක් නිකුත් කිරීමේ දින සිට මාස දෙකක් ඇතුළත කිසිම ආයාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, ඒ නියෝගය ඒ කාලය ගත වූ විට ක්‍රියාත්මක විය යුතුය. මාස දෙකක් ඇතුළත ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක නියෝග ස්ථිර කරනු ලබනතෙක්, ඒ නියෝගය බල නොපැවැත්විය යුතුය.

(4) සමිතියක ලියාපදිංචිය රෙජිස්ට්‍රාර් විසින් (1) වැනි උපවගන්තිය යටතේ අවලංගු කරනු ලබන අවස්ථාවක, සමිතියේ ලියාපදිංචිය වලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන තෙක් හෝ ආයාචනයකදී, අමාත්‍යවරයා විසින් ඒ නියෝගය අවලංගු කරනු ලබන තෙක්, සමිතියේ පොත් පත්, ලේඛන හා දේපළ භාරව සිටීමට හා ඒ සමිතියේ කටයුතු පාලනය කිරීම සඳහා එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර්ට පත් කළ හැකිය.

ඒ තැනැත්තා හෝ තැනැත්තන් පත් කරනු ලැබූ විට, සමිතියේ කාරක සභාව විසින් හෝ සමිතියේ පොත් ලේඛන හා වෙනත් දේපළ භාරව සිටින වෙන යම් තැනැත්තකු විසින්, ඒ පොත්, ලේඛන හා දේපළ පළමු සඳහන් තැනැත්තා හෝ තැනැත්තන් වෙත භාර දිය යුතු අතර, ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වනතුරු හෝ අමාත්‍යවරයා විසින් ආයාචනයකදී ඒ නියෝගය අවලංගු කරන තෙක්, ඒ කාරක සභාව අක්‍රිය විය යුතුය.

සමිතියක ලියාපදිංචිය අවලංගු කිරීම.

50. යම් ලියාපදිංචි කළ සමිතියක්,

(අ) සමිතිය හෝ සංගමයේ සාමාජික සංඛ්‍යාව මෙම ප්‍රඥප්තියේ 4 (1) (අ), (ආ) වගන්තිවල නියම කර ඇති අවම සංඛ්‍යාවට වඩා අඩුව ඇත්නම් හෝ,

(ආ) සමිතිය ලියාපදිංචි කළ දින සිට අවුරුදු එකක කාල පරිච්ඡේදයක් තුළ ඒ ලියාපදිංචි කළ සමිතිය වැඩ ආරම්භ කොට නැත්නම්, මේ වගන්තිය යටතේ අවලංගු කිරීමේ නියෝගය පැනවීමේ දිනයට පෙර අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් තුළ අක්‍රීයව තිබුණේ නම්, රෙජිස්ට්‍රාර් විසින් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් අවලංගු කළ හැකිය.

ලියාපදිංචිය අවලංගු කිරීමේ බලපෑම

51. ලියාපදිංචි කළ සමිතියක ලියාපදිංචිය, 49 වන වගන්තිය හෝ 50 වන වගන්තිය යටතේ වූ නියෝගයකින් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, මෙහි මින්මතු විසුරුවා හැරීමේ දිනය වශයෙන් සඳහන් කෙරෙන, ඒ නියෝගය ක්‍රියාත්මක වන දින සිට ඒ සමිතිය සංස්ථාවක් ලෙස පැවතීම නතර විය යුතුය.

එසේවුවද මේ ප්‍රඥප්තියෙන් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සමිතිය වෙත පැවැරුනු යම් වරප්‍රසාදය රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය සඳහා පත් කරනු ලැබූ යම් ඈවරකරුවකු හෝ ඈවරකරුවන් වෙත පවරනු ලැබූ ලෙස පැළකිය යුතුය.

සමිතියක ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසු ඈවර කිරීම

52. 49 වෙනි වගන්තිය හෝ 50 වෙනි වගන්තිය යටතේ සමිතියක ලියාපදිංචි අවලංගු කරනු ලැබූ අවස්ථාවක, ඒ සමිතියේ ඈවරකරු හෝ ඈවරකරුවන් වශයෙන් එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර් විසින් පත්කළ හැකිය. අවස්ථාවෝචිත පරිදි 49 වන වගන්තිය හෝ 50 වන වගන්තිය යටතේ අවලංගු කිරීමේ නියෝග ක්‍රියාත්මක වන දිනයේ සමිතියේ සියළුම දේපළ, ඈවරකරු වෙත හෝ ඈවරකරුවන් වෙත පවරනු ලැබිය යුතුය.

ඇවරකරුගේ බලතල

53. (1) 52 වන වගන්තිය යටතේ පත් කරන ලද ඇවරකරුවකුට රෙජිස්ට්‍රාර්ගේ මග පෙන්වීම හා පාලනයට හා 54 වන වගන්තිය යටතේ වූ නියෝගයන් මගින් රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන යම් සීමා කිරීම්වලට යටත්ව පහත සඳහන් කටයුතු කිරීමේ බලය තිබිය යුතුය.

(අ) සමිතියේ වත්කම්වලට, සමිතියේ සාමාජිකයින් සහ අතීත සාමාජිකයින් විසින් ගෙවිය යුතු හෝ සමිතියේ මියගිය සාමාජිකයින්ගේ මුදල්වලින් ලැබිය යුතු දායක මුදල් කලින් කල නිශ්චය කිරීම ;

(ආ) හිමිකම් කියාපෑම, සමිතියේ පොත්පත්වල එතෙක් සටහන්වී නැති ණය හිමියන් විසින් සිය හිමිකම් පෑම ඇතුළත් කරවා ගැනීම සඳහා ඒවා ඉදිරිපත් කළ යුත්තේ හෝ ඒ හිමිකම් කියා පෑම ඔවුන් විසින් තහවුරු කරනු ලැබීමට පෙර කෙරෙන වත්කම් බෙදාදීමෙන්, ඒ ණය හිමියන් අත්හරිනු ලැබිය යුත්තේ යම් දිනයකට පෙරද, ඒ දිනය ප්‍රකාශනයකින් හෝ දැන්වීමකින් නියම කිරීම ;

(ඇ) ණය හිමියන් අතර උද්ගත වන ප්‍රමුඛත්වය පිළිබඳව යම් ප්‍රශ්නයක් මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව තීරණය කිරීම ;

(ඈ) 58 වන වගන්තියෙහි සඳහන් යම් විස්තරයක යම් ආරවුලක් ,(සමිතිය සම්බන්ධයෙන් එහි වූ සඳහන් කිරීම, ඇවරකරු සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම ලෙස තේරුම් ගෙන ) ඒ වගන්තිය යටතේ බේරුම් කිරීම සඳහා යොමු කිරීම සහ සමිතිය වෙනුවෙන් තමාගේ නමින් හෝ සිවිල් නඩු හා වෙනත් නීති කෘත්‍ය පැවරීම හා ඒ නීති කෘත්‍යවලදී ප්‍රතිවාද ඉදිරිපත් කිරීම ;

(ඉ) ඇවර කිරීමේ ගාස්තු කවර පුද්ගලයින් විසින් කවර ප්‍රමාණවලින් දැරිය යුතුදැයි යන්න තීරණය කිරීම ;

(ඊ) සමිතිය ගණන් බේරා වසා දැමීමේ දී අවශ්‍ය විය හැකි වත්කම් එකතු කොට බෙදා දීම සම්බන්ධයෙන් විධාන කිරීම ;

(උ) රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය කලින් ලැබී ඇත්තේ නම් මිස, සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් කියාපෑම් සමථයකට පත්කිරීම ;

(ඌ) ඇවර කිරීම නිසි ලෙස පැවැත්වීම සඳහා අවශ්‍යවිය හැකි සාමාජිකයින්ගේ මහා සභා රැස්වීම් කැඳවීම ;

(එ) සමිතියේ පොත්පත්, ලේඛන හා වත්කම් තම සන්තකයට ගැනීම ;

(ඒ) සමිතියේ දේපළ විකිණීම හා ඇවර කිරීම සම්බන්ධයෙන් රැස්කරන ලද සියලුම මුදල් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන යම් ආකාරයකින් තැන්පත් කිරීම ;

(ඔ) වැඩදායි ලෙස ගණන් බේරා වසා දැමීම සඳහා අවශ්‍ය වියහැකිතාක් දුරට සමිතියේ කටයුතු පවත්වා ගෙන යාම, එසේ වු ද ණය දෙන සමිතියක ඇවරකරුට යම් ණය මුදල් නිකුත් කිරීම සඳහා මෙහි අඩංගු කිසිවකින් හිමිකම් නො ලැබිය යුතුය ;

(ඕ) රෙජිස්ට්‍රාර් විසින් වත්කම් බෙදා දීමේ යෝජනා ක්‍රමයක් අනුමත කරනු ලැබූ විට සමිතියේ වත්කම් පහසු ආකාරයකින් බෙදාදීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

(2) 49 වන වගන්තිය හෝ 50 වන වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියක සාමාජිකයකු හෝ කලින් සිටි සාමාජිකයකු විසින් යම් ණයක් ගෙවීමට ඇති හා ඒ තැනැත්තා ඒ අවලංගු කිරීමේ දිනයෙන් පසු, මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ අන්කිසි සමිතියක සාමාජිකයකු වන අවස්ථාවක, 52 වන වගන්තිය යටතේ පත්කරන ලද පළමු සඳහන් සමිතියේ ඇවරකරුට රෙජිස්ට්‍රාර්ගේ මග පෙන්වීම හා පාලනයට සහ, 54 වන වගන්තිය යටතේ වූ නියෝගයක් මගින් රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන වෙන යම් සීමා කිරීම්වලට ද යටත්ව, ඒ තැනැත්තාට ඒ අන් සමිතියෙන් අයවිය යුතු මුදලින්, ඒ ණයට වැඩි නොවන මුදලක් ඒ සාමාජිකයාගෙන් ඒ අන් සමිතියට අය විය යුතු ණයක් වූවාක් මෙන් අයකොට ඒ මුදල ඇවරකරු වෙත යවන ලෙස ඒ අන් සමිතියට නියම කිරීමේ බලයක් තිබිය යුතුය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද ඇවරකරුට, ඒ වෙනුවෙන් සාදනු ලැබිය හැකි රීතිවලට යටත්ව, මේ වගන්තියේ කාර්යයන් කර ගෙන යාම පිණිස යම් බලතල අවශ්‍ය වන ප්‍රමාණයට, දිසා අධිකරණයක් සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ විධිවිධාන සලස්වා ඇති මාර්ගයෙන්ම හා (අවශ්‍ය විය හැකි පමණින්) ඒ ආකාරයටම පාර්ශවකරුවන් හා සාක්ෂිකරුවන් කැඳවීමට හා පැමිණ සිටීමට ඔවුන්ට බල කිරීමටත්, ලේඛන ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට බල කිරීමටත් බලයක් තිබිය යුතුය.

ඈවර කිරීම පාලනය කිරීමට රෙජිස්ට්‍රාර් සතු බලය.

54 (1) ඈවරකරු රෙජිස්ට්‍රාර්ගේ පාලනයට හා විධානයට යටත්ව සිය බලතල ක්‍රියාවේ යෙදවිය යුතු අතර,

(අ) ඈවරකරුවකු විසින් කරනු ලබන යම් නියෝගයක් පරිච්ඡින්න කොට හෝ වෙනස් කොට අවශ්‍ය කවර හෝ අලුත් නියෝගයක් කිරීමට ද,

(ආ) ඈවරකරුවකු ධූරයෙන් ඉවත් කිරීමට ද,

(ඇ) සමිතියේ සියලු පොත් ලේඛන හා වත්කම් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද,

(ඈ) 53 වගන්තිය යටතේ වූ ඈවරකරුවකුගේ බලතල ලියවිල්ලකින් වූ නියෝගයකින් සීමා කිරීමට ද,

(ඉ) ගණන් ඉදිරිපත් කරන ලෙස ඈවරකරුට තම අභිමතය පරිදි නියම කිරීමට ද,

(ඊ) ඈවරකරුගේ ගණන් විගණනය කරවා ගැනීම හා සමිතියේ වත්කම් බෙදා දීමට බලය පැවරීමට ද,

(උ) ඈවරකරුට පාරිශ්‍රමික ගෙවීමට, නියෝග කිරීම හෝ

(ඌ) ඈවරකරු හා යම් තෘතිය පාර්ශවකරුවකු හා අතර පවතින්නා වූ 53(1) (ඈ) වැනි වගන්තිය යටතේ බේරුම් කිරීමකට යොමු කළ හැකි ආරවුලක් නොවන යම් ආරවුලක් ඒ පිළිබඳව බේරුම්කරුගේ
තීරණයෙන් පාර්ශවකරුවන් බැඳී සිටිය යුතු අතර, ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් විසින් කරනු ලැබූ නියෝගයක් ක්‍රියාත්මක කරන ආකාරයකට ඒ තීරණය ක්‍රියාත්මක කළ හැකි විය යුතු ය.

(2) අතිරික්ත අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදල පිහිටුවනු ලැබිය යුතු අතර, ඈවරකරු විසින් රැස්කරනු ලබන සියලුම මුදල් ඒ අරමුදලට බැර කළ යුතුය. තවද, ඒ අරමුදල රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතුය.

නියෝග ක්‍රියාත්මක කිරීම.

55. (1) 54 වන වගන්තිය යටතේ තමා වෙත යොමුකරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් වූ බේරුම්කරුගේ තීරණයෙන් පාර්ශවකරුවන් බැඳී සිටිය යුතු අතර, ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් විසින් කරනු ලැබූ නියෝගයක් ක්‍රියාත්මක කරන ආකාරයට ඒ තීරණය ක්‍රියාත්මක කළ හැකි වි යුතුය.

(2) බේරුම්කරුවකු විසින් හෝ රෙජිස්ට්‍රාර් විසින් 53 වන වගන්තිය හෝ 54 වන වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගයක් කිරීම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු අතර, ඒ සමිතියේ ලියාපදිංචි කරන ලද කාර්යාලය පිහිටි ස්ථානය සම්බන්ධයෙන් අධිකරණයේ බලය ඇති යම් සිවිල් අධිකරණයක් විසින්, ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කරන ආකාරයෙන්, ඒ නියෝගය ක්‍රියාත්මක කළ යුතුය. එසේ වුවද, ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියක ණය හිමියකු වන යම් බැංකුවකට, යම් ඈවරකරුවකු හෝ රෙජිස්ට්‍රාර් විසින් 53 වන වගන්තිය හෝ 54 වන වගන්තිය යටතේ කරන ලද නියෝගයකට විරුද්ධව, ඒ ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්ගේ නියෝගයේ දිනයේ සිට මාස දෙකක් ඇතුළත අමාත්‍යවරයා වෙත ආයාචනා කිරීමට හිමිකම් තිබිය යුතුය.

(3) 53 වන වගන්තිය යටතේ හෝ 54 වන වගන්තිය යටතේ ඈවරකරුවකු විසින් හෝ රෙජිස්ට්‍රාර් විසින් නියෝග කිරීමෙන් පසු, මාස දෙකක් ඇතුළත අමාත්‍යවරයා වෙත කිසිම ආයාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, ඒ ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්ගේ එම නියෝගය, එම කාල පරිච්ඡේදය ගතවීමෙන් පසු බල පැවැත්විය යුතුය. මාස දෙකක් ඇතුළත අමාත්‍යවරයා වෙත ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ස්ථිර කරනු ලබන තෙක් ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්ගේ නියෝගය බල නොපැවැත්විය යුතුය.

සිවිල් අධිකරණයකට අධිකරණබලය සීමාකිරීම.

56. මෙහි පෙරාතුව ප්‍රකාශිතවම විධිවිධාන සැළසුණු ප්‍රමාණයට හැර, මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ සමිතියක් විසුරුවා හැරීමට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් කිසිම සිවිල් අධිකරණයකට, කිසිම අධිකරණ බලයලක් නො තිබිය යුතුය.

ඈවර කිරීම අවසන් කිරීම.

57. (1) ලියාපදිංචිය අවලංගු කළ සමිතියක් ඈවරකිරීමේදී සංචිත අරමුදල් ඇතුලු අරමුදල්, 40(2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, ප්‍රථම කොට ඈවර කිරීමේ ගාස්තුව සඳහා ද ඊළඟට ආණ්ඩුවේ ණය, ආණ්ඩුව ඇපවූ ණය හා පළාත් සභාවේ ණය හා පළාත් සභාව ඇපවූ ණය ආපසු ගෙවීම් සඳහා ද, ඉක්බිතිව සමිතියේ වෙනත් වගකීම් ඉටු කිරීම පිණිස ද, ඉක්බිතිව කොටස් ප්‍රාග්ධනය ගෙවීම පිණිස ද, ඉක්බිතිව සමිතියේ අතුරු ව්‍යවස්ථා වලින් අවසර ලැබෙන්නේ

නම්, ලාභ බෙදනු නොලැබූ යම් කාල පරිච්ඡේදයක් සඳහා අවුරුද්දකට 6%ට නොවැඩි ප්‍රමාණයකින් ලාභාංශයක් ගෙවීම සඳහා ද, ලාභ පිළිබඳව සුදුස්සක් කරනු නොලැබූ යම් කාල පරිච්ඡේදයක් වෙනුවෙන් ඒ කාල පරිච්ඡේදය විසුරුවා හැරීමේ දිනයට පෙරාතුවම වූ අවස්ථාවක සාමාජිකයන්ට ප්‍රතිදානයක් ගෙවීම සඳහා ද යෙදිය යුතුය.

(2) සමිතියක ඈවර කිරීම අවසන් කරනු ලැබූ හා ඒ සමිතියේ යම් ණය හිමියකු විසින් වත්කම් බෙදා දීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑමක් ඉදිරිපත් කරනු නොලැබූ හෝ ඒ දේ ඔහුට නොලැබුණු විට, ඈවර කිරීම අවසන් කිරීමේ දැන්වීම ගැසට් පත්‍රයේ පළකළ යුතුය. තවද, ඒ සමිතියේ අරමුදල් සම්බන්ධයෙන් වූ යම් හිමිකම් කියාපෑමක් පිළිබඳව කිසිම නඩුවක්, එය ඒ දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට මාස තුනක් ඇතුළත ආරම්භ වන්නේ නම් මිස, පවත්වාගෙන නොයා යුතුය.

(3) ඈවර කිරීම අවසන් වීමෙන් පසු අතිරික්ත මුදල්වලින් 50% ක් සමුපකාර දෙපාර්මේන්තුවේ අතිරික්ත අරමුදලටත්, 50%ක් දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයටත් පැවරිය යුතුය. ඒ අරමුදල් පාලනය සඳහා රීති පැනවිය යුතුය.

*XI වැනි පරිච්ඡේදය*

*ආරවුල්*

58. (1) ලියාපදිංචි කළ සමිතියක ව්‍යාපාරයකට සම්බන්ධ යම් ආරවුලක් ;

ආරවුල් සමථයකට පත් කිරීම.

(අ) සාමාජිකයින්, හිටපු සාමාජිකයින් සහ සාමාජිකයින්, හිටපු සාමාජිකයින් හා මියගිය සාමාජිකයින් මගින් හිමිකම් කියාපාන තැනැත්තන් අතර හෝ සමිතියේ අතීත හෝ වර්තමාන නිලධරයන් හෝ සේවකයන් අතර හෝ මියගිය නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ උරුමකරුවන්ගේ හෝ නීත්‍යානුකූල නියෝජිතයන් අතර හෝ,

(ආ) සාමාජිකයකු, හිටපු සාමාජිකයකු හෝ සාමාජිකයකු, හිටපු සාමාජිකයකු හෝ මියගිය සාමාජිකයකු මගින් හිමිකම් කියාපාන තැනැත්තකු හා සමිතිය, එහි කාරක සභාව හෝ එහි අතීත හෝ වර්තමාන නිලධරයකු හෝ සේවයකු හෝ මියගිය යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ උරුමකරුවකු හෝ නීත්‍යානුකූල නියෝජිතයකු අතර හෝ,

(ඇ) සමිතිය හෝ එහි කාරක සභාව හා සමිතියේ අතීත හෝ වර්තමාන යම් නිලධරයකු හෝ සේවකයකු හෝ යම් මියගිය නිලධරයකු හෝ සේවකයකුගේ යම් උරුමකරුවකු හෝ නීත්‍යානුකූල නියෝජිතයකු අතර හෝ,

(ඈ) සමිතිය හෝ එහි කාරක සභාව සහ ;

(1) ව්‍යාපාරය හෝ ඉන් කොටසක් ඒ සමිතියට පවරනු ලැබූ වෙනයම් සමිතියක සාමාජිකයකුව හෝ නිලධරයකුව හෝ සේවකයකුව සිටි යම් තැනැත්තකු,

(2) (1) අනු ඡේදයෙහි සඳහන් සමිතියේ සාමාජිකයකුගේ හිටපු සාමාජිකයකුගේ හෝ මියගිය සාමාජිකයකු මගින් හිමිකම් කියාපාන යම් තැනැත්තකු,

(3) (1) අනු ඡේදයෙහි සඳහන් සමිතියේ යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ උරුමකරුවකු හෝ නීත්‍යානුකූල නියෝජිතයකු වන යම් තැනැත්තකු අතර හෝ,

(ඉ) සමිතිය හා ලියාපදිංචි කළ අන් කිසි සමිතියක් අතර උද්ගත වන්නේ නම්, තීරණය සඳහා ඒ ආරවුල රෙජිස්ට්‍රාර් වෙතට යොමු කරනු ලැබිය යුතුය. අතීත හෝ වර්තමාන සාමාජිකයකුගෙන්, නිලධාරියකුගෙන් හෝ සේවකයකුගෙන් හෝ මියගිය සාමාජිකයකුගේ නිලධරයකුගේ හෝ සේවකයකුගේ යම් නම් කල තැනැත්තකුගෙන් හෝ උරුමකරුවන් හෝ නීත්‍යානුකූල නියෝජිතයකුගෙන් ලියාපදිංචි සමිතියකට අයවිය යුතු යම් ණයක්, ඉල්ලීමක් හෝ ආලාභයක් සඳහා, ඒ සමිතිය විසින් ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑමක් හෝ ලියාපදිංචි කළ සමිතියකින් අතීත, වර්තමාන නිලධාරියකුගෙන් හෝ සේවකයකුගෙන් හෝ සාමාජිකයකුගෙන් සාමාජිකයකුට හෝ ලියාපදිංචි සමිතියකින් මියගිය සාමාජිකයකුගේ නිලධාරියකුගේ යම් නම් කළ තැනැත්තකුට උරුමකරුවකුට හෝ නීත්‍යානුකූල නියෝජිතයකුට අයවිය යුතු යම් ණයක් හෝ ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් පෑමක් ඒ ණය ඉල්ලීම හෝ අලාභය පිළිගත යුතු වුවද, නොවුවද, මේ උප වගන්තියේ අර්ථානුකූලව සමිතියේ ව්‍යාපාරයට අදාළ ආරවුලක් ලෙස සලකනු ලැබිය යුතුය.

(2) රෙජිස්ට්‍රාර් විසින් (1) වැනි උප වගන්තිය යටතේ යොමු කිරීමක් ලැබීමෙන් පසු—

(අ) තමා විසින්ම ඒ ආරවුල සම්බන්ධයෙන් තීරණය කළ හැකි ය ; නැතහොත්

(ආ) ඒ පිළිබඳව සුදුස්සක කිරීම සඳහා බේරුම්කරුවකු හෝ බේරුම්කරුවන් වෙත යොමු කළ හැකිය.

(ඇ) ආරවුලේ වටිනාකම රුපියල් දස ලක්ෂයකට වැඩිවන අවස්ථාවක තිදෙනෙකුගෙන් යුත් බේරුම්කාර මණ්ඩලයක් වෙත යොමු කළ යුතුය. එම බේරුම්කාර මණ්ඩලය පහත දක්වා ඇති ආකාරයට විය යුතුය. ඒ මණ්ඩලයට ආරවුලේ එක් එක් පාර්ශවකරුවෙකු විසින් එක් එක්කෙනා බැගින් නම්කළ යුතු අතර තුන්වැනි බේරුම්කරු රෙජිස්ට්‍රාර් තුමා විසින් නම් කළ යුතුය. රෙජිස්ට්‍රාර් තුමා නම් කළ අය මණ්ඩලයේ සභාපති වශයෙන් ක්‍රියා කළ යුතුය.

(ඈ) (i) ආරවුලක යම්කිසි පාර්ශ්වකරුවෙකුට ඉහත (ඇ) උප වගන්තිය යටතේ බේරුම්කරුවෙකු නම්කරන ලෙස රෙජිස්ට්‍රාර් තමා දන්වා සිටි විට දින 15ක් ඇතුළත එසේ නොකළහොත් ඒ වෙනුවට කෙනෙකු නම් කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට පුළුවන.

(ii) ආරවුලක යම් පාර්ශ්වකරුවෙකු විසින් නම්කරන ලද බේරුම්කරුවෙකු මිය ගියහොත් හෝ බේරුම්කරුවෙකු වශයෙන් කටයුතු කිරීමට අකමැති වුවහොත් හෝ ඒ කටයුතු පැහැර හැරිය හොත් හෝ බේරුම්කරුවෙකු වශයෙන් කටයුතු කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා දැන ගතහොත් හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ අන් කරුණක් නිසා හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට ඔහුට නොහැකි වුවහොත් හෝ එසේ මිය ගියාවූ හෝ බේරුම්කරුවෙකු ලෙස කටයුතු කිරීමට අකමැති වූ හෝ ක්‍රියා කිරීම පැහැර හැරියා වූ හෝ ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර් විසින් දැන ගත්තා වූ හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ වෙනත් කරුණක් නිසා බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වූ හෝ ඒ තැනැත්තා වෙනුවට වෙනත් බේරුම්කරුවෙකු නම්කරන ලෙස ඒ පාර්ශ්වකරුට දන්වා සිටීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇති වේ. ඒ පාර්ශ්වකරු දින 15ක් ඇතුළත එසේ නොකළහොත් රෙජිස්ට්‍රාර්තුමා විසින් බේරුම්කරුවෙකු නම් කළ හැකිය.

(iii) රෙජිස්ට්‍රාර්තුමා විසින් බේරුම්කරුවෙකු ලෙස නම් කළ අයෙකු මිය ගියහොත් හෝ බේරුම්කරුවෙකු ලෙස කටයුතු කිරීමට අකමැති වුවහොත් හෝ ඒ කටයුතු පැහැර හැරිය හොත් හෝ බේරුම්කරුවෙකු ලෙස කටයුතු කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා දැන ගත හොත් පළාතේ නොසිටීම නිසා හෝ අසනීප නිසා හෝ අන් කරුණක් නිසා හෝ බේරුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීමට ඔහුට නොහැකි වුවහොත් හෝ එසේ මිය ගියාවූ හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට අකමැතිවූ හෝ ක්‍රියා කිරීම පැහැර හැරියාවූ හෝ ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා දැන ගත්තාවූ හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ වෙනත් කරුණක් නිසා හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වූ හෝ ඒ තැනැත්තා වෙනුවට වෙනත් කෙනෙකු නම් කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(ඈ) බේරුම්කරුවන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් වෙත ඉදිරිපත් වන කරුණක් තීරණය කළ යුත්තේ වැඩි දෙනාගේ අදහස අනුවය. එක එක බේරුම්කරුගේ අදහස් වෙනස් වූ විට මණ්ඩලයේ සභාපති තැනගේ අදහස පරිදි තීරණ කළ යුතුය.

(3) බේරුම්කරුවෙකුගේ හෝ බේරුම්කරුවන්ගේ හෝ තීන්දුවෙන් අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවන් විසින් රෙජිස්ට්‍රාර් වෙත ආයාචනයක් ඉදිරිපත් කළ හැකිය. තීන්දුවකට විරුද්ධව රෙජිස්ට්‍රාර්ට කරන ඕනෑම ආයාචනයක්, ඊට හේතු ලියවිල්ලකින් දක්වමින් , තීන්දුව දෙන ලද දින සිට දින හැටක් ඇතුළත කළ යුතුය. ආයාචනය කරනු ලබන්නේ තීරක විභාගයක වගඋත්තර පාර්ශ්වකරුවකු විසින් තමාට විරුද්ධව දෙන ලද තීන්දුවකට එරෙහිව නම්, තීන්දුකරන ලද මුදලින් 10% ක් ද, ආයාචනා කරනු ලබන්නේ මුදලක් ඉල්ලා සිටි පැමිණිලි පාර්ශ්වකරුවකු විසින් නම්, තීරක විභාගයේ දී ඉල්ලා සිටි මුදලින් 10% ක් ද ආයාචනා තැන්පත් මුදල වශයෙන් ආයාචනය සමග යැවිය යුතුය. එතකුදු වුවත්, කවර පාර්ශ්වයක් විසින් හෝ යැවිය යුතු තැන්පත් මුදල රුපියල් පන්සියයකට නොඅඩු විය යුතු අතර, උපරිමය රුපියල් දසදහස නොඉක්මවිය යුතුය.

(4) ඉහත සඳහන් කරුණුවලට අනුකූල නොවන ආයාචනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

(5) එතකුදු වුවත් පාර්ශවකරුවන්ගෙන් ලිඛිතව හෝ වාචිකව හෝ කරුණු විමසීමටත් අවශ්‍යයයි හැඟෙන්නේ නම් පාර්ශවකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් කැඳවීමට බලය ඇති වන්නේ ය.

(6) ආයාචනයක් ඉදිරිපත් කිරීමට සාධාරණ කරුණු තිබේ යැයි රෙජිස්ට්‍රාර්වරයා විසින් සෑහීමකට පත් වූ විට, ආයාචනය ඉදිරිපත් කරන තැනැත්තා විසින් තැන්පත් කරන ලද මුදල ඔහුට ආපසු දිය හැකි අතර, ආයාචනයක් ඉදිරිපත් කිරීමට සාධාරණ හේතු නොමැති යැයි රෙජිස්ට්‍රාර් සෑහීමට පත්වූ විට, ආයාචනා කරන තැනැත්තා විසින් තැන්පත් කරන ලද මුදල සමුපකාර අරමුදලට බැර කළ යුතුය.

(7) බේරුම්කරුවකු වශයෙන් නීතිඥයකු පත්කළ නොහැකි අතර, රෙජිස්ට්‍රාර් හෝ බේරුම්කරු හෝ බේරුම්කරුවන් ඉදිරියේ කිසිම පාර්ශ්වකරුවකු වෙනුවෙන් නීතිඥයකුට පෙනී සිටීමට නුපුළුවන.

(8) ඉහත (2) වැනි උප වගන්තිය යටතේ හෝ (3) වැනි උප වගන්තිය යටතේ හෝ(4) වැනි උපවගන්තිය යටතේ වූ ආයාචනයක දී රෙජිස්ට්‍රාර්ගේ තීරණය අවසානාත්මක විය යුතු අතර, ඒ පිළිබඳව යම් සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතු ය.

(9) ඉහත (2) වැනි උප වගන්තිය යටතේ බේරුම්කරුවකුගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුව සම්බන්ධයෙන් (3) වැනි උප වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත කිසිම ආයාචනයක් යොමු කරනු නොලබන්නේ නම් හෝ එබඳු යම් ආයාචනයක් අත්හරිනු ලබන්නේ නම් හෝ ඉල්ලා අස්කර ගනු ලබන්නේ නම්, ඒ තීන්දුව අවසානාත්මක විය යුතු අතර, ඒ පිළිබඳව කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

(10) මේ වගන්තිය යටතේ ආරවුලක විෂය වන යම් හිමිකම් පෑමක් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ 58 වන වගන්තිය යටතේ කෙරෙන කටයුත්තක් සම්බන්ධයෙන් කාලසීමා ආඥා පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(11) මෙම වගන්තිය යටතේ පැන නැගෙන ආරවුලක් සමථමූල මණ්ඩල පනත යටතේ විභාග කිරීමට හෝ සමථයකට පත්කිරීමට නොහැකි වන අතර එවැනි සමථයක් මෙම වගන්තිය යටතේ කටයුතු කිරීමට බාධාවක් නොවිය යුතුය.

(12) මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබූ ආරවුලක්, ලියාපදිංචි කළ සමිතියක ව්‍යාපාරයට අදාළ ආරවුලක් ද යන්න පිළිබඳව යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත්, ඒ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්ගේ තීරණය අවසානාත්මක විය යුතු අතර, ඒ පිළිබඳව කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

(13) මේ වගන්තිය යටතේ සාමාජිකයා යන්නට ආශ්‍රිත සාමාජිකයෙක් ද ඇතුළත් වේ.

59. (1) 58 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබූ ආරවුලක් හෝ ආයාචනයක් සම්බන්ධයෙන්, ඔහුගේ තීරණයකින් (මේ වගන්තියේ මින්මතු එය තීරණයක් යනුවෙන් හඳුවන්වනු ලැබේ.) ඒ වගන්තිය යටතේ බේරුම්කරුවෙකු වෙත යොමු කරනු ලැබූ ආරවුලක් පිළිබඳවූත්, ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත යථා පරිදි ආයාචනයක් ඉදිරිපත් කරනු නොලැබුණත්, මේ වගන්තිය මින්මතු තීන්දුවක් යනුවෙන් හඳුන්වනු ලබන තීන්දුවකින් කෙරෙන නිගමනය, ඒ ආරවුලේ අනෙක් පාර්ශ්වකරුට මුදලක් අයවිය යුතු බව වූත්, ඒ මුදල ඊට සම්බන්ධ ගාස්තු හා පොලී ඇතොත් ඒවා සමග නොගෙවා ඇත්තාවූත් අවස්ථාවක, රෙජිස්ට්‍රාර් විසින් ඒ මුදල අයවිය යුත්තේ යම් පාර්ශ්වකරුවන්ගෙන් ද මේ වගන්තියේ මින්මතු පැහැර හරින්නා යනුවෙන් හඳුන්වනු ලබන ඒ පාර්ශ්වකරු සම්බන්ධයෙන් , තීරණයක් හෝ තීන්දුවක් ක්‍රියාත්මක කිරීම.

(අ) ගාස්තු හා පොලිය සමග ඒ මුදල පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම අඩංගු සහතිකයක් දිස්ත්‍රික් ලේකම්වරයෙකු, සහකාර දිස්ත්‍රික් ලේකම්වරයකු, පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් වෙත නිකුත් කිරීම හෝ,

(ආ) ගාස්තුව හා පොලිය ඇතොත් ඒ පොලිය ද සමග ඒ මුදල පිළිබඳව විස්තර හා පැහැර හරින්නාගේ නම අඩංගු සහතිකයක්, ඒ පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ඒ පැහැර හරින්නාට අයත් යම් චංචල හෝ නිශ්චල දේපලක් පිහිටි යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති දිසා අධිකරණයක් වෙත නිකුත් කිරීම හෝ,

(ඇ) ගාස්තුව හා පොලිය ඇතොත් ඒ පොලිය ද සමග අයවිය යුතු මුදල පිළිබඳව විස්තර හා පැහැර හරින්නාගේ නම සහ අන්තිමට දැනගත් ඔහුගේ ව්‍යාපාරික හෝ පදිංචි ස්ථානය අඩංගු සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාසයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයෙකු වෙත නිකුත් කළ යුතු ය.

(2) (අ) රෙජිස්ට්‍රාර් විසින් (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්වරයකු, සහකාර දිස්ත්‍රික් ලේකම්වරයකු පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් වෙත සහතිකයක් නිකුත් කරනු ලබන අවස්ථාවක පැහැර හරින්නාගේ චංචල දේපල තහනමට ගෙන විකුණා ගාස්තු හා පොලී සමග ඒ මුදල අයකර ගැනීමට සැලැස්වීමට ඒ නිලධාරියාට මෙයින් බලය පවරා නියම කරනු ලැබේ.

(ආ) ඒ නිලධාරියා විසින් ඒ වෙනුවෙන් ඉතාමත්ම අවස්ථානුකූල යැයි සලකනු ලබන යම් ආකාරයකින්, එකී තහනමට ගැනීම ක්‍රියාත්මක කළ යුතු අතර, එසේ තහනමට ගත් සෑම දේපලක්ම පැහැර හරින්නා විසින් ගාස්තු හා වියදම් ගෙවීමකට යටත්ව දින පහක් තබා ගත යුතුය. පැහැර හරින්නා විසින් ගාස්තු හා පොලිය සහිතව අයවිය යුතු ඒ මුදල් ද, ඒ දේපල තහනමට ගෙන තබා ගැනීමේ වියදම් හා වැය බරද, එකී දින පහ ඇතුලත නොගෙවන්නේ නම් අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික් ලේකම්, සහකාර දිස්ත්‍රික් ලේකම් හෝ පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් විසින් එකී දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට සැලැස්විය යුතු ය.

(ඇ) ඒ විකිණීමෙන් ලැබෙන්නා වූ මුදල,

(i) පළමුකොට ඒ දේපල තහනමට ගැනීමට, තබා ගැනීමට හා විකිණීම පිළිබඳවූ වියදම් හා ගාස්තු ගෙවීමට ද,

(ii) දෙවනුව ගාස්තු හා පොලිය සමග අයවිය යුතු මුදල පියවීමට ද යෙදිය යුතු අතර, යම් ශේෂයක් ඇතොත් තහනමට ගත් දේපළ අයිතිකරු වෙතද ගෙවිය යුතු ය.

(3) (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, එය ලැබීමෙන් පසු ඒ අධිකරණය විසින් එය පැහැර හරින්නාගේ සියලුම චංචල හෝ නිශ්චල දේපල හෝ ඉන් යමක් හෝ ඒ මුදල අයකර ගැනීම සඳහා පිස්කල් විසින් අවශ්‍ය යැයි සැලකිය හැකි ඉන් යම් කොටසක් තහනමට ගෙන විකුණන ලෙස පිස්කල්ට බලය පැවරෙන හා නියම කෙරෙන දේපළ තහනම් ඇස්කීසියක් පිස්කල් වෙත නිකුත් කරන ලෙස විධාන කළ යුතුය. ඒ තහනමට ගෙන විකිණීම කෙරෙහි සහ ඊට අදාළව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය දක්වා වූ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(4) (1) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ මහෙස්ත්‍රාත්වරයකු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, මුදල් අයකර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව වැඩිදුරටත් ක්‍රියා නොකළ යුතු මන්දැයි හේතු දැක්වීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් එය පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතු ඔහු විසින් නොදක්වන ලද්දේ නම් බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි වුවද, දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදකට ඒ පැහැර හරින්නන් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද දණ්ඩන නියමයකින් නියම කෙරුනු දඩයක් ලෙස ඒ මුදල සලකනු ලැබිය යුතුය. එවිට 1979 අංක 15 දරන අපාරාධ නඩු විධාන සංග්‍රහ පනතේ විධිවිධාන පරිදි, එය පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතු ඔහු විසින් නොදක්වන ලද්දේ නම්, බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි වුවද, දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදකට ඒ පැහැර හරින්නා සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද දණ්ඩන නියමයකින් නියම කෙරුනු දඩයක් ලෙස, ඒ මුදල සලකනු ලැබිය යුතුය. එවිට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 291 වැනි වගන්තියේ එහි (1) වන උප වගන්තියේ (අ) හා (ඇ) ඡේද හැර විධිවිධාන අදාළ විය යුතු අතර, ඒ දණ්ඩන නියම කරන අවස්ථාවේදී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක් ඔහු විසින් කළ හැකිය. දඩයක් ලෙස මුදල් ගෙවීමට පැහැර හරින්නා එකඟත්වය පළකරන විට, එම මුදල රෙජිස්ට්‍රාර්වරයා විසින් සඳහන් කරන බැංකු ගිණුමකට හෝ වෙනත් ආකාරයකට ගෙවන ලෙසට මහෙස්ත්‍රාත්වරයකු පැහැර හරින්නකුට නියම කළ හැකි අතර, කුවිතාන්සියේ නීත්‍යානුකූල බව පිළිබඳ සැහීමකට පත්වන අවස්ථාවක, එය උසාවියට ගෙවන

ලද මුදලක් ලෙස සලකා නියෝග කිරීමට මහෙස්ත්‍රාත්වරයකුට බලය ඇතිවේ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 291 වැනි වගන්තිය අනුව නියම කරනු ලැබූ දඩය පැහැර හැරීමේ ලා බන්ධනාගාර ගත කිරීමේ කාලයට දණ්ඩන නියමයක් කරනු ලැබූ යම් පැහැර හරින්නකු 59 (1) (ඇ) වගන්තියේ නිශ්චිත සහතිකයේ සඳහන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් නිදහස් කරනු නොලැබිය යුතුය.

(5) රෙජිස්ට්‍රාර් මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන අවස්ථාවක, ඒ පිළිබඳ නිවේදනයක් පෞද්ගලිකව භාරදීමෙන්, ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ විද්‍යුලි පණිවුඩ මාර්ගයෙන් යැවීමෙන්, පැහැර හරින්නා වෙත නිකුත් කළ යුතුය. එහෙත් පැහැර හරින්නාට ඒ නිවේදනය නොලැබීම හේතු කොටගෙන මේ වගන්තිය යටතේ වූ නීති කෘත්‍යය අවලංගු නොවිය යුතුය.

(6) මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍ය වලදී රෙජිස්ට්‍රාර්ගේ සහතිකයේ වූ යම් ප්‍රකාශයක නිවැරදි භාවය සලකා බැලීමට, පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳ තීරණය කිරීමට යම් දිසා අධිකරණයකට හෝ මහෙස්ත්‍රාත්වරයකුට, මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය. නැතහොත් නියම නොවිය යුතුය.

(7) (3) වන උප වගන්තිය යටතේ විකිණීමෙන් ලත් යම් මුදලක් හා (4) වන උපවගන්තිය යටතේ ගෙවන ලද හෝ අය කරන ලද යම් මුදලක් අවස්ථාවෝචිත පරිදි දිසා අධිකරණය හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතුය. රෙජිස්ට්‍රාර් විසින් ඒ මුදල සම්බන්ධයෙන් අදාළ තීරණය හෝ තීන්දුව අනුව සුදුස්සක් කළ යුතුය.

60 (1) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකත්වය සඳහා යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ඒ සමිතිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ඒ තැනැත්තා විසින් රෙජිස්ට්‍රාර් වෙත ආයාචනය කළ හැකි ය. ඒ ආයාචනය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්ගේ තීරණය අවසානාත්මක විය යුතු අතර, එම පිළිපැදීමට සමිතිය බැඳී සිටිය යුතුය.

වෙනත් ඇතැම් කරුණු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් විසින් තීරණය කළ යුතු බව.

(2) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයකු ඒ සමිතියේ ධූරයකට යථා පරිදි තෝරා පත්කර ගන්නා ලද්දේ ද යන්න සම්බන්ධයෙන් හෝ සාමාජිකයකු, ඒ සමිතියේ සාමාජිකයකුව හෝ නිලධරයකුව සිටීම නතර වූයේ ද යන්න සම්බන්ධයෙන් හෝ සමිතියේ යම් මහා සභා රැස්වීමක් වලංගු ලෙස පවත්වනු ලැබුවේද යන්න සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් උද්ගත වන අවස්ථාවක, ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් විසින් තීරණය කළ යුතු අතර, ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතුය.

(3) රජයේ මුදල් වලින් ක්‍රියාත්මක වන ලියාපදිංචි සමිතියක කටයුතු කාර්යක්ෂම කළමනාකරණය කිරීම සහතික කර ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ සමිතියට ආණ්ඩුවෙන් හා පළාත් සභාවෙන් කරන ලද ආයෝජන හෝ මුදලින් නැතහොත් භාණ්ඩ වලින් දෙන ලද යම් අත්තාකාරම් හෝ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා, ඒ ලියාපදිංචි සමිතියේ කාරක සභාවට සාමාජිකයින් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් නම් කිරීම අවශ්‍ය බව හෝ අවස්ථාවෝචිත බව රෙජිස්ට්‍රාර්ගේ මතය වන අවස්ථාවක, මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් නීතියක හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල හෝ කුමක් සඳහන්ව තිබුණද, ඔහු විසින් ඔහුගේ මතය අනුව අවශ්‍ය හෝ අවස්ථාවෝචිත පරිදි ඒ ලියාපදිංචි සමිතියේ කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් යටත් පිරිසෙයින් එක් අයෙකුවත් සමුපකාර දෙපාර්තමේන්තු නිලධාරියෙකු ඇතුළත් වන රාජ්‍ය නිලධාරීන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් හා එම සමිතියේ සභාපති හා උප සභාපති එම අය අතුරෙන් රෙජිස්ට්‍රාර්වරයා නම් කළ විට, තත් කාලයේ ධූරය දරමින් සිටි සභාපතිගේ හෝ උපසභාපතිගේ හෝ නිලය එම නම් කිරීමෙන් අහෝසි වේ.

එසේ වුවද නම් කරන සාමාජික සංඛ්‍යාව, ඒ කාරක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් හරි අඩකට වඩා අඩුවිය යුතුය.

*XII වැනි පරිච්ඡේදය*

*රීති*

61. (1) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලුම රීති සබරගමු පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය.

රීති

(2) විශේෂයෙන්ම හා (1) වැනි උප වගන්තියෙන් පැවරෙන බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව ඒ රීති වලින්,

(අ) සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි හා ඒ ඉල්ලුම් කිරීම පිළිබඳ කාර්ය පරිපාටිය නියම කළ හැකිය.

(ආ) සාමාජිකයින් වශයෙන් ඇතුළත්වීම සඳහා ඉල්ලුම්කරන හෝ සාමාජිකයින් වශයෙන් ඇතුළත් කර ගනු ලැබූ තැනැත්තන් විසින් අනුගමනය කළ යුතු කොන්දේසි නියමකළ හැකි අතර කලින් කල සාමාජිකයින් තෝරා පත්කර ගැනීම හා ඇතුළත් කර ගැනීම හා සාමාජිකත්වයේ අයිතිවාසිකම් පාවිච්චි කිරීමට පෙරකළ යුතු ගෙවීම් හා ලබාගත යුතු සම්බන්ධතා සඳහා විධිවිධාන සැලැස්විය හැකිය.

(ඇ) සාමාජිකයින් ඉල්ලා අස්වීම සහ නෙරපීම සඳහා ද, ඉල්ලා අස්වන හෝ නෙරපනු ලබන සාමාජිකයින්ට කළ යුතු ගෙවීම් සඳහා ද, හිටපු සාමාජිකයින්ගේ වගකීම් සඳහා ද විධිවිධාන සැලැස්විය හැකි ය.

(ඈ) ලියාපදිංචි කළ සමිතියක සාමාජික සංඛ්‍යාව ඒ සමිතිය විසින් සීමා කළහැකි ප්‍රමාණය නියම කළ හැකි ය.

(ඉ) (3) වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව සාමාජිකයකු සතුව තිබිය හැකි ලියාපදිංචි කළ සමිතියක ප්‍රාග්ධනයේ වැඩිම කොටස් ගණන හෝ පංගුව නියම කළ හැකි ය.

(ඊ) මුදල් ණය හෝ ණයවර සඳහා ඉල්ලුම් කරන සාමාජිකයින් විසින් කළ යුතු ගෙවීම්, අනුගමනය කළ යුතු කොන්දේසි හා ලියා අත්සන් කළ යුතු බැඳුම්කරවල හෝ වෙනත් ලේඛනවල ආකෘති, දිය හැකි ණයවර හෝ ප්‍රදානය කළ හැකි ණයවරවල කාල සීමාව, තනි සාමාජිකයින්ට පනවනු ලැබිය හැකි උපරිම මුදල හා ඔවුන් සම්බන්ධයෙන් ඉඩ දෙනු ලැබිය හැකි උපරිම මුදල හා ඔවුන් සම්බන්ධයෙන් ඉඩදෙනු ලැබිය හැකි වැඩිම ණයවර නියම කළ හැකි ය.

(උ) සමිතියක සාමාජිකයින්ට ලාභ බෙදිය හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද, ඒ කොන්දේසි හා සමිතිය විසින් ගෙවිය හැකි ලාභාංශ පිළිබඳ උපරිම ප්‍රමාණය නියම කළ හැකි ය.

(ඌ) සාමාජිකයින්ගේ මහා සභා රැස්වීම් සඳහා ද, ඒ රැස්වීම්වල කාර්යය පරිපාටිය සඳහා ද, ඒ රැස්වීම්වලදී පාවිච්චි කළ යුතු බලතල සඳහා ද විධිවිධාන සැලැස්විය හැකි ය.

(එ) කාරක සභා වල සාමාජිකයින් සහ වෙනත් නිලධරයන් පත් කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම හා ඔවුන් සේවයෙන් ඉවත් කිරීම සඳහා ද, කාරක සභා රැස්වීම්වල කාර්ය පරිපාටිය සඳහා ද, කාරක සභාව හා වෙනත් නිලධරයන් විසින් පාවිච්චි කළ යුතු බලතල හා ඉටුකළ යුතු යුතුකම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකි ය.

(ඒ) සමිතිය විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි හෝ සෑදිය යුතු කරුණු සහ අතුරු ව්‍යවස්ථා සෑදීමේ දී වෙනස් කිරීමේ දී හා පරිච්ඡින්න කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, ඒ අතුරු ව්‍යවස්ථා පැනවීමට, වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි නියම කළ හැකි ය.

(ඔ) ලියාපදිංචි කළ සමිතියක් විසින් තැබිය යුතු ගණන් හා පොත් සහ ලියාපදිංචි කළ සමිතියක වත්කම් හා බැරකම් පෙන්නුම් කෙරෙන ශේෂ පත්‍රයක් ද, කලින් කල පළකිරීමට නියම කළ හැකි ය.

(ඕ) ලියාපදිංචි කළ සමිතිවල ගණන් විගණනය කිරීම සඳහා සහ ඒ විගණනය සඳහා ගෙවිය යුතු යම් ගාස්තු ඇතොත් ඒ ගාස්තු ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම ද, පවත්නා සමිති විගණනය කිරීම, ඒවා පරිපාලනය කිරීම සහ ඒවාට සහාය දීම සඳහා ද, සමුපකාර ප්‍රචාරක කටයුතු සඳහා ද, සමුපකාර පුහුණුව හා අධ්‍යාපනය සඳහා ද පාවිච්චි කිරීම පිණිස සමුපකාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලකට සියලුම ලියාපදිංචි කළ සමිතිවලින් හෝ එවැනි යම් සමිතිවලින් දායක මුදල් අය කිරීමට විධිවිධාන සැලැස්වීම ද, ඒ අරමුදලේ පරිපාලනය සඳහා විධිවිධාන සැලැස්වීම ද කළ හැකිය.

(ක) ලියාපදිංචි කළ සමිතිවල පොත්පත්වල ඇතුළත්ව ඇති සටහන්වල පිටපත් සහතික කළ හැකි තැනැත්තන් හා ආකාරය සඳහා විධිවිධාන සැලැස්විය හැකිය.

(ග) සාමාජිකයින්ගේ නාම ලේඛනයක් සහ සාමාජිකයින්ගේ වගකීම කොටස්වලින් සීමාසහිත වූ අවස්ථාවක, කොටස් පිළිබඳ නාමලේඛනයක් සකස් කොට, පවත්වා ගෙන යාම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකි ය.

(ජ) සංචිත අරමුදල් ඇති කොට පවත්වා ගෙන යාම හා ඒ අරමුදල් යෙදිය හැකි පරමාර්ථ සඳහා ද, ලියාපදිංචි කළ සමිතියක පාලනය යටතේ ඇති යම් අරමුදල් ආයෝජනය කිරීම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය.

(ට) බේරුම්කරුවකු හෝ බේරුම්කරුවන් පත්කිරීමේ ක්‍රමය හා රෙජිස්ට්‍රාර් හෝ ඒ බේරුම්කරු හෝ බේරුම්කරුවන් ඉදිරියෙහි පැවැත්වෙන කෘත්‍යයන්හිදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය හා රෙජිස්ට්‍රාර්ගේ තීරණ හෝ බේරුම්කරුවන්ගේ තීන්දු ක්‍රියාත්මක කළ යුතු ආකාරය නියම කළ හැකිය.

(ඩ) මෙම ප්‍රඥප්තියේ සඳහන් අතිරික්ත අරමුදලක් පිහිටුවා පවත්වා ගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම හා ඒ අරමුදල් වියදම් කළහැකි ආකාරය හා කාර්යයන් නියම කිරීම කළ හැකි ය.

(ණ) මියගිය සාමාජිකයකුගේ සම්බන්ධතාවයේ වටිනාකම නිශ්චය කළ යුතු ආකාරය සඳහා ඒ සම්බන්ධතාවයේ වටිනාකම ගෙවිය හැකි හෝ පැවරිය හැකි තැනැත්තකු නම් කිරීම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය.

(ත) කොටස් මගින් හෝ ණයපත්‍ර මගින් හෝ වෙනයම් ආකාරයකින් අරමුදල් ලබාගත හැකි ආකාරය හා තැන්පත් සම්බන්ධයෙන් ගෙවිය හැකි පොළී ප්‍රමාණය විධිමත්කළ හැකි ය.

(ද) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයකු කළමනාකරණ කාරක සභාවේ හෝ ප්‍රාදේශීය හෝ ගබඩා කාරක සභාවක සාමාජිකයකු ලෙස තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් වූ නුසුදුසුකම් නියම කිරීම.

(න) ලියාපදිංචි කරන ලද සමිති විසින් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු වාර වාර්තා සහ ඒ වාර වාර්තා ඉදිරිපත් කළ යුතු තැනැත්තන් හා ආකාරය නියම කළ හැකිය.

(ප) සමිතියක් වෙත හෝ ඒ මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීමට අදාළ යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ ගිවිසුමක් කඩ කිරීම පිළිබඳව යම් ප්‍රශ්නයක් නිශ්චය කළ හැකි ආකාරය හා එබඳු යම් කඩකිරීමක් නිසා වූ ප්‍රමාණ කළ අලාභය නිශ්චය කළහැකි හෝ තක්සේරු කළ හැකි ආකාරය නියම කළ හැකිය.

(බ) ආණ්ඩුවෙන් හෝ පළාත් සභාවෙන් මුදල් ආධාර සඳහා ඉල්ලුම් කරන ලියාපදිංචි කළ සමිතියක් විසින් පිළිපැදිය යුතු කොන්දේසි නියම කළ හැකිය.

(ම) රෙජිස්ට්‍රාර් විසින් කරන ලද නියෝගවලට විරුද්ධව අමාත්‍යවරයා වෙත ආයාචනයක් ඉදිරිපත් කළ හැකි විය යුතු වූද, මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නැත්තාවූ ද කරුණු නිශ්චයකළ හැකිය.

(ය) 52 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ ඇවරකරුවකු විසින් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය හා ඒ බේරුම්කරුගේ නියෝගවලට විරුද්ධව ආයාචනා ඉදිරිපත් කළ හැකි විය යුතු අවස්ථා නියම කළ හැකිය.

(ර) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ රීති යටතේ ආයාචනා ඉදිරිපත් කිරීම ඇසීම හා ඒ පිළිබඳ සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් පාවිච්චි කළ යුතු ආකෘති ගෙවිය යුතු ගාස්තු පිළිපැදිය යුතු කාර්ය පරිපාටිය හා ඒවාට සම්බන්ධ හෝ ආනුශංගික සියලු කරුණු නියම කළ හැකිය.

(ල) වෙළඳ බඩු තොග නොවන වෙනත් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම, මිලට ගැනීම, තෑගි වශයෙන් දීමේ දී, උකස් කිරීමේ දී හා වෙනත් ආකාරයෙන් බැහැර කිරීමේ දී එම දේපළ සම්බන්ධ වටිනාකම සීමාවන් නියම කිරීම කළ හැකිය.

(3) සබරගමුව පළාත් සභාව විසින් අනුගමනය කරනු ලැබුවේ නම් මිසක කිසිම රීතියක් බල නොපැවැත්විය යුතුය. එසේ අනුමත කරන ලද රීති ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතුය. මෙම රීති බලපවත්වනු ලබන්නේ, එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට විය යුතු ය.

## *XIII වැනි පරිච්ඡේදය*

### *ආණ්ඩුවට සහ පළාත් සභාවට අයවිය යුතු ණය*

ආණ්ඩුවට සහ පළාත් සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීම.

62\. (1) ලියාපදිංචි කළ සමිතියකින් හෝ ලියාපදිංචි කළ සමිතියක යම් නිලධරයකුගෙන් හෝ සාමාජිකයකුගෙන් හෝ එහි හිටපු සාමාජිකයකුගෙන්, එම තත්ත්වයෙන් ආණ්ඩුවේ ණය, පළාත් සභාවේ ණය, ආණ්ඩුවට ඇපවූ ණය හා පළාත් සභාවට ඇප වූ ණය වෙනුවෙන් අය විය යුතු මුදල් හා 46 වැනි වගන්තිය යටතේ ආණ්ඩුව හා පළාත් සභාවට ප්‍රදානය කරන ලද යම් ගාස්තු ද ඇතුළත්ව අයවිය යුතු සියලු මුදල් හා අයවිය යුතු ණය අයකර ගැනීම සඳහා ආණ්ඩුවේ ණයකරු ආඥාපනත යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන්ම අය කර ගනු ලැබිය හැකි අතර, එකී ආඥාපනතේ 40(2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව අන්කිසි තැනැත්තකුට හෝ තැනැත්තන්ට අයවිය යුතු මුදල් වලට ඉහළින් ඒවාට ප්‍රමුඛත්වය ලැබිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියකින් ආණ්ඩුවට සහ පළාත් සභාවට අයවිය යුතු (1) වැනි උප වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් පළමුව සමිතියේ දේපළවලින් අයකර ගත හැකිය. දෙවනුව සාමාජිකයින්ගේ වගකීම සීමා කරනු ලැබූ ලියාපදිංචිකළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට, සාමාජිකයින්ගේ වගකීමේ සීමාවට යටත්ව සාමාජිකයින්ගෙන් ද, තෙවනුව අන් සමිති සම්බන්ධයෙන් වූ විට සාමාජිකයින්ගෙන් ද අයකර ගත හැකිය.

## *XIV වැනි පරිච්ඡේදය*

### *විවිධ කරුණු*

ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ නියමයන්ගෙන් යම් සමිතියක් නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු විශේෂ බලය

63\. මේ ප්‍රඥප්තියේ කුමක් සඳහන්ව ඇත ද, එය නොතකා සබරගමුව පළාත් සභාවේ සමුපකාර විෂයය භාර අමාත්‍යවරයා විසින් එක් එක් අවස්ථාවේ විශේෂ ආඥාවකින් හා ඔහු විසින් නියම කළ හැකි යම් කොන්දේසිවලට යටත්ව ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ වූ නියමයන්ගෙන් යම් නියමයකින් යම් සමිතියක් නිදහස් කළ හැකි ය.

මේ පනතේ විධිවිධානවලින් සමිති නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු විශේෂ බලය.

64\. සබරගමුව පළාත් සභාවේ සමුපකාර විෂයය භාර අමාත්‍යවරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ ආඥාවක් මාර්ගයෙන්, මේ ප්‍රඥප්තියේ විධිවිධානවල යම් විධානයකින්, ලියාපදිංචි කළ යම් සමිතියක් හෝ සමිති පන්තියක් නිදහස් කිරීම හෝ ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් දිනක සිට හෝ යම් වෙනස් කිරීම් සහිතව, ඒ විධිවිධාන යම් සමිතියකට හෝ සමිති පන්තියකට අදාළ විය යුතු යැයි විධාන කිරීම කළ හැකිය.

*සමුපකාර යන වචනයේ පාවිච්චි සීමා කිරීම*

65. (1) "එක්සත් සහකාර" යන වචනය හෝ "සමුපකාර" යන වචනය හෝ දෙමළ භාෂාවෙන් "අයිකිය" ( ஐக்கிய ) යන වචනය හෝ "කුට්ටුරවු" ( கூட்டுறவு ) යන වචනය හෝ ඉංග්‍රීසි "කෝපරේටිව්" (Co-operative) යන වචනය කොටසක් වන යම් නාමයක් හේ අභිධානයක් යටතේ වෙළඳාම් කිරීම හෝ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම, ලියාපදිංචි කළ සමිතියක් නොවන කිසිම තැනැත්තෙක් විසින්, සබරගමුව පළාත් සභාවේ සමුපකාර විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව නොකළ යුතුය.

එසේ වුවද 1921 සැප්තැම්බර් මස 22 වැනි දිනට පෙර යම් තැනැත්තකු විසින් වෙළඳාමක් කර ගෙන යන ලද්දේ හෝ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන ලද්දේ යම් නාමයක් හෝ අභිධානයක් යටතේ ද, ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ සම්බන්ධතාවෙහි අනුප්‍රාප්තිකයා විසින් ඒ නාමය හෝ අභිධානය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් මේ වගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතුය.

(2) මේ වගන්තියේ විධිවිධාන කඩකරන කවර තැනැත්තකු වුවද, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් 500ක් දක්වා විය හැකි දඩයකට හා වරද අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන අවස්ථාවක් වූ විට, ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසු තව දුරටත් ඒ වරද කරගෙන යනු ලබන්නේ නම්, එක් එක් දිනය සඳහා රුපියල් 50ක අතිරේක දඩයකට ද යටත්විය යුතුය.

*සමිතියට ලැබිය යුතු මුදල් ආපසු ගෙවීමට හෝ අන් දේපලක් ආපසු භාරදීමට රෙජිස්ට්‍රාර් විසින් නියම කළ හැකි බව.*

66. (1) ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් 44 වන වගන්තිය යටතේ විගණනයක දී හෝ 46 වන වගන්තිය යටතේ විභාගයකදී හෝ පරීක්ෂණයක දී ලියාපදිංචි කළ සමිතියක පොත්පත් පරීක්ෂා කර බැලීමේදී හෝ ගණන් බේරා වසා දැමීමේදී හෝ ඒ සමිතිය සංවිධානය කිරීමෙහි ලා හෝ එහි කළමණාකාරිත්වයෙහිලා සහභාගී වූ මේ ප්‍රඥප්තියෙහි හෝ වෙනත් පනතක විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන රීතිවලට හෝ නියෝගවලට නැතහොත් සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට හෝ කාරක රීතිවලට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද මුදල් කාර්ය පරිපාටියට හෝ රෙජිස්ට්‍රාර්වරයා හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව හෝ විසින් නිකුත් කරන ලද යම් පොදු විධිවිධානවලට පටහැනිව, සමිතියේ අරමුදල් ප්‍රයෝජනයට ගත් යම් තැනැත්තෙකුගෙන්, තැනැත්තන් කණ්ඩායමකින් හෝ ඒ සමිතියේ හිටපු හෝ දැනට සිටින යම් නිලධරයකුගෙන් හෝ සේවකයකුගෙන්, ඒ සමිතියට යම් මුදලක් හෝ අන් දේපළක් ලැබිය යුතු බව පෙනෙන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි රෙජිස්ට්‍රාර් විසින් තමාගේ ඕනෑකම පිට හෝ සමිතියේ කාරක සභාවේ හෝ ඇවරකරුගේ හෝ යම් ණය හිමියකුගේ හෝ දායකයකුගේ ඉල්ලීම පිට, ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන් කණ්ඩායමේ හෝ නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පරීක්ෂා කර,

(අ) ඒ මුදල හෝ එහි කොටසක් රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන පොළියක් සමග ආපසු ගෙවන ලෙස ;

(ආ) ඒ අන් දේපළ හෝ එහි කොටස් ආපසු භාර දෙන ලෙස ; හෝ

(ඇ) සමිතියේ වත්කම්වලට රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවන ලෙස

ඔහුට හෝ ඒ කණ්ඩායමට නියම කරමින් නියෝගයක් කළ හැකිය. එවැනි යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට විරුද්ධව එබඳු යම් නියෝගයක් කිරීමට පෙර, රෙජිස්ට්‍රාර් විසින් ඒ නියෝගය නොකළ යුත්තේ මන්දැයි කරුණු කියා සිටීමට හා හේතු දැන්වීමට ඒ තැනැත්තාට හෝ තැනැත්තන් කණ්ඩායමට අවස්ථාවක් දිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් මුදලක් ආපසු ගෙවීම සඳහා හෝ එහි වත්කම්වලට යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවීම සඳහා (1) වැනි උප වගන්තිය යටතේ කරන ලද නියෝගයක් අනුව ක්‍රියාකර නොමැති අවස්ථාවක, සමිතියේ ලියාපදිංචි කළ ව්‍යාපාරය පිහිටි ස්ථානය පිහිටි හෝ නියෝග කරන ලද්දේ යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව ද, ඒ තැනැත්තා තැනැත්තන් කණ්ඩායම හෝ නිලධරයා හෝ සේවකයා පදිංචිව සිටින හෝ ව්‍යාපාරය කරගෙන යන ස්ථානය පිහිටි කොට්ඨාසය තුළ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලුම් කොට, ඒ මුදල බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි, දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදක් සඳහා, ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම හෝ නිලධාරියා හෝ සේවකයා සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියම කරන

ලද දඩයක් වූවාක් මෙන් අයකර ගනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 291 වන වගන්තියේ (එම වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) හා (ඇ) ඡේද හැර) විධිවිධාන ඉක්බිතිව අදාළ විය යුතුය. තවද ඒ දණ්ඩනය නියම කරන අවස්ථාවේදී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක් ද ඔහු විසින් කළ හැකිය. රෙජිස්ට්‍රාර් විසින් කරනු ලැබූ යම් නියෝගයක නිරවද්‍යතාවය මේ වගන්තිය යටතේ කිසිම නීති කෘත්‍යයකදී සලකා බැලීමට, පරීක්ෂා කිරීමට හෝ තීරණය කිරීමට, මහෙස්ත්‍රාත්වරයාට මේ වගන්තියේ නිසිවකින් බලය ලැබීම හෝ නියමවීම සිදු නොවිය යුතුය.

(3) අන්කිසි ලිඛිත නීතියක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් (1) වැනි උප වගන්තියේ සඳහන් යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ නිලධරයකු හෝ සේවකයකුට විරුද්ධව නඩුවක් පැවරීම හෝ පවත්වා ගෙන යාම, මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන හෝ ඒ යටතේ යම් නියෝගයක් කිරීම හෝ හේතු කොට ගෙන, වැලැක්වෙන ලෙස හෝ ඒ කෙරෙහි වෙනයම් ආකාරයකින් බලපාන ලෙස සලකනු ලැබීම හෝ තේරුම් ගැනීම නොකළ යුතුය.

වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම

(4) (1) ලියාපදිංචි සමිතියක සභාපතිවරයා විසින් හා කාරක සභාවේ සෑම සාමාජිකයකු විසින්, වාර්ෂිකව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත, නියමිත ආකෘතියේ වූ වත්කම් හා බැරකම් ප්‍රකාශයක්, ඒ ප්‍රකාශය කරන්නේ යම් වර්ෂයක් වෙනුවෙන් ද, ඒ වර්ෂයේ මාර්තු මස 31 වෙනි දිනට පැවැති පරිදි,

(අ) ඔහුගේ සියළු වත්කම් හා බැරකම් පිළිබඳ
(ආ) ඔහුගේ කලත්‍රයාගේ සියළු වත්කම් හා බැරකම් පිළිබඳව සහ
(ඇ) ඔහුගේ එක් එක් දරුවාගේ සියළු වත්කම් හා බැරකම් පිළිබඳව ද කළ යුතුය.

(2) (1) වැනි උපවගන්තියේ සඳහන් ප්‍රකාශය ලියාපදිංචි සමිතියක සභාපතිවරයා හෝ කාරක සභාවේ සෑම සාමාජිකයකු විසින් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත අවස්ථාවෝචිත පරිදි ඒ සභාපතිවරයා හෝ කාරක සභාවේ සාමාජිකයා තෝරා පත් කර ගනු ලැබූ හෝ පත් කර ගනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත ද ඔහු සභාපති ධූරය හෝ කාරක සභා සාමාජික ධූරය දැරීම නතර වුවහොත් මිස, ඔහු ප්‍රථම ප්‍රකාශය කළ වර්ෂයෙන් පසු එළඹෙන එක් එක් අනුක්‍රමික වර්ෂයේ ජූලි මස 01 දිනට පෙර දී කළ යුතුය.

විශ්වාසය කඩකිරීම සම්බන්ධයෙන් නිලධරයන් ආදීන්ගේ වගකීම

67. ලියාපදිංචි කළ සමිතියක ගණන්, 44 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි විගණනය කරනු ලැබීමෙන් පසු හෝ 46 වන වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ පරීක්ෂණයකින් පසු හෝ සමිතිය නිලධරයකු හෝ සාමාජිකයකු හෝ සේවකයකු වශයෙන් වූ තම තත්ත්වයෙන් යම් මුදලක්, යම් බඩු හෝ දේපල භාරව සිටින හෝ යම් අවස්ථාවක භාරව සිටි නැතහොත් ඒ මුදල්, බඩු හෝ දේපල පිළිබඳ ආධිපත්‍යය ඇතිව සිටින හෝ යම් අවස්ථාවක ඇතිව සිටි හෝ තැනැත්තකු විසින්, ඒ නිලධාරයා, සාමාජිකයා හෝ සේවකයා වශයෙන් තමා ළග තබා ගෙන සිටින හෝ තමාගෙන් අයවිය යුතු බවට, තමා විසින් තබන ලද හෝ අත්සන් කරන ලද ගණන් පොත්වල හො ප්‍රකාශවල පෙන්නුම් කෙරෙන යම් මුදලක් හෝ එහි ශේෂයක් ගෙවන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස හෝ එවැනි බඩුවල හෝ දේපලවල වටිනාකම ගෙවන ලෙස හෝ රෙජිස්ට්‍රාර් විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබීමෙන් පසු, ඒ තැනැත්තා විසින් ඒ මුදල හෝ එහි ශේෂය හෝ වහාම ගෙවීම හෝ ඉදිරිපත් කිරීම හෝ එම බඩුවල හෝ දේපලවල වටිනාකම ගෙවීම හෝ යථා පරිදි ඒ සඳහා ගණන් ඉදිරිපත් කිරීම පැහැර හැරියහොත්, ඔහු සාපරාධි විශ්වාසය කඩ කිරීමේ වරදට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු 10ක් නොඉක්මවන කාල සීමාවකට දෙආකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට යටත්විය යුතුවාක් මෙන්ම, දඩයකට ද ඒ දඬුවම මහෙස්ත්‍රාත්වරයෙකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවුවද, ඔහු යටත්විය යුතුය.

නඩු පැවරීම මෙහෙයවීම කවුරුන් විසින් කළ යුතු ද යන වග

(අ) ලියාපදිංචි කරන ලද සමිතියකට, අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් විමර්ශනය පැවැත්වීම, විභාග කිරීම හා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XVIII වැනි පරිච්ඡේදය යටතට වැටෙන නඩු පැවරීම මෙහෙයවීම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු විසින් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

යම් තොරතුරක් යනාදිය ඉදිරිපත් කරන ලෙස රෙජිස්ට්‍රාර් විසින් බැංකුවකට නියම කළ හැකි බව.

68. අන්කිසි ලිඛිත නීතියක කුමක් සඳහන් වී ඇති ද එය නොතකා රෙජිස්ට්‍රාර් විසින් අවශ්‍යයැයි ඔහු අදහස් කරන අවස්ථාවක,

(අ) යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් බැංකුව සමග කරනු ලබන ගනුදෙනු සම්බන්ධයෙන් යම් තොරතුරක් සපයන ලෙස,

(ආ) බැංකුව සමග පවතින ඒ සමිතියේ ගිණුම් පෙන්නුම් කරන පිටපතක් බැංකු විසින් තබා ඇති ලෙජරයෙන් ඉදිරිපත් කරන ලෙස හෝ,

(ඇ) සමිතියේ බැරට ගෙවන ලද හෝ සමිතිය විසින් පිටසන් කරන ලද යම් චෙක්පත් ඉදිරිපත් කරන ලෙස යම් බැංකුවකට නියම කළ හැකිය.

69. සමාගම් ආඥා පනතේ හා වෘත්තීය සමිති ආඥා පනතේ විධිවිධාන හා ඒ ආඥා පනත් සංශෝධනය කරන ලද යම් ප්‍රඥප්තිවල විධිවිධාන, මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සමිතිවලට අදාල නොවිය යුතුය.

සමාගම් ආඥා පනත හා වෘත්තීය සමිති ආඥාපනත අදාල නොවිය යුතු බව

70. (1) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම නිසා සබරගමු පළාත් තුළ ක්‍රියාත්මකවීම නවතන ලද සංශෝධන සමග කියැවෙන ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 05 දරන සමූපකාර සමිති පනත හෝ එම පනත මගින් අවලංගු කරන ලද යම් නීතියක් යටතේ හෝ මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම නිසා බල රහිත වන සබරගමු පළාත් සභාව විසින් සම්මත කරන ලද 1994 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තිය යටතේ හෝ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැලකෙන සෑම සමිතියක්ම මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථා වෙනස් කරනු ලබන හෝ පරිච්ඡින්න කරනු ලබන තෙක් මේ ප්‍රඥප්තියේ ප්‍රකාශිත විධිවිධාන සමග ගැලපෙන පමණට අඛණ්ඩව බල පැවැත්විය යුතුය.

දැනට පවත්නා සමිති, රීති යනාදිය පිළිබඳ තබා ගැනීම

(2) මේ ප්‍රඥප්තිය සබරගමු පළාත් තුළ ක්‍රියාත්මකවීම නිසා නවතන ලද සංශෝධන සමග කියැවෙන ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 05 දරන සමූපකාර සමිති පනත හෝ ඒ පනත මගින් අවලංගු කරන ලද යම් නීතියක් යටතේ සාදනු ලැබූ මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ පවත්නා සියළු රීති ඒවා මේ ප්‍රඥප්තියේ විධිවිධාන සමග ගැලපෙන පමණට මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ ලෙස සැලකිය යුතු අතර ඒ රීති වෙනුවට 61 වන වගන්තිය යටතේ අළුතින් රීති සාදනු ලබන තෙක් ඒවා අඛණ්ඩව බලපැවැත්විය යුතුය.

(3) මේ ප්‍රඥප්තියෙන් සබරගමු පළාත් තුළ ක්‍රියාත්මකවීම නවතන ලද සංශෝධන සමග කියැවෙන 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත මගින් අවලංගු කරන ලද යම් නීතියක් යටතේ හෝ කරන ලද හෝ කරන ලදැයි සැලකෙන සියළු පත්කිරීම් හා නියෝග නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ ලෙස සැලකෙන සියළුම නිවේදන හා දැන්වීම් බේරුම්කරුවන් විසින් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන සියළු ප්‍රදාන හා රෙජිස්ට්‍රාර්වරයා විසින් ගන්නා ලද හෝ ගන්නා ලදැයි සැලකෙන සියළු තීරණ හා පවරනු ලැබූ හෝ පවරනු ලැබූ ලෙස සැලකෙන සියළුම සිවිල් නඩු හා වෙනත් නඩු කටයුතු හා උද්ගතව ඇති සියළුම ආරවුල් හැකිතාක් දුරට පිළිවෙලින් මේ ප්‍රඥප්තිය යටතේ කරනු ලැබූ ලෙස නිකුත් කරනු ලැබූ ලෙස හා ගනු ලැබූ ලෙස සැලකිය යුතුය.

71. යම් වර්ගයක බැංකු ව්‍යාපාරයක් පවත්වා ගෙන යන යම් ලියාපදිංචි සමිතියක් විසින්, එහි තැන්පතු මුදල් නීති පනතේ v වන පරිච්ඡේදයේ ii කොටස යටතේ රක්ෂණය කොට ඇති අවස්ථාවක, ඒ කොටස යටතේ රක්ෂිත බැංකු තැන්පතු වලට අදාල වත්කම්, මේ පනතේ අන්කිසි විධානයක කුමක් සඳහන්ව ඇත ද, එය නොතකා ඒ තැන්පතුවලට අදාල බැරකම් පියවීම නොවන වෙනයම් කාර්යයක් සඳහා නොගත යුතුය.

මුදල් නීති යටතේ රක්ෂිත තැන්පතුවලට අදාල වත්කම් ඒ තැන්පතු වලට අදාල බැරකම් පියවීම සඳහා විනා ප්‍රයෝජනයට නොගත යුතු බව

72. (1) මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා රෙජිස්ට්‍රාර් විසින් හෝ ඔහු විසින් යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තකු විසින් නියම කරන ලද යම් ක්‍රියාවක් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ඕනෑකමින්ම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ එහි නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයකු සහ මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන යම් කැඳවීමේ නියෝගයකට, නියමයකට හෝ නීත්‍යානුකූල ලිඛිත නියෝගයකට, ඕනෑකමින් හෝ යම් සාධාරණ හේතුවක් නොමැතිව අකීකරු වන හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ යම්

ප්‍රඥප්තිය අනුව ක්‍රියා නොකිරීම සඳහා දණ්ඩනය

තොරතුරක් සපයන ලෙස නියම කිරීමට බලය පවරනු ලැබූ තැනැත්තකු විසින්, එසේ සැපයීමට නීත්‍යානුකූලව නියම කරන ලද යම් තොරතුරක් සැපයීම පැහැර හරින සෑම නැතැත්තකු සහ ඕනෑකමින් අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ එහි නිලධාරයෙකු හෝ සේවයෙකු හෝ සාමාජිකයෙකු, මේ ප්‍රඥප්තිය යටතේ වරදකරුවකු විය යුතුය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් යම් වරදක් කරන සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට අවුරුදු 2 ක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙආකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් 12,000 ක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාර ගත කිරීම හා දඩය යන දෙකටම හෝ ඒ දඩුවම මහෙස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවුවද, ඔහු යටත්විය යුතුය.

(3) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක, කරන ලද වරද යම් යුතුකමක් කඩකිරීමක් වේද, ඒ යුතුකම ඉටු කිරීමට අතුරු ව්‍යවස්ථාවලින් හෝ රීති වලින් බැඳී සිටින එම සමිතියේ සෑම නිලධාරයකුම හෝ එබඳු නිලධරයෙන් නොසිටී නම්, කාරක සභාවේ සෑම සාමාජිකයකුම, ඒ සාමාජිකයා ඒ වරද කිරීම ගැන නොදැන සිටි බව හෝ එය වැළැක්වීමට ප්‍රයත්න දැරූ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු විසින් ඒ වරද කරන ලද්දේ නම්, ඔහු යටත්විය යුතු දණ්ඩනයටම යටත් විය යුතුය.

රෙජිස්ට්‍රාර් වරයාගේ ක්‍රියාසම්බන්ධයෙන් ආරක්ෂාව

73. ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේදී හෝ කර්තව්‍යය කිරීමේදී සද්භාවයෙන් කරන ලද හෝ කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස්වරයන්ට මේ ප්‍රඥප්තියේ 44 46 49 52 66 සහ 67 වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් යථා පරිදි බලය දෙන ලද හෝ පත්කරන ලද වෙනත් තැනැත්තකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතුය.

පනත් සහ ප්‍රඥප්ති බලනොපැවැත් වෙන බව

74. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමත් සමග පහත සඳහන් පනත්වල විධිවිධාන සබරගමුව පළාත් සභාව තුළ බලපවත්වනු නොලැබිය යුතුය.

(i) 1972 අංක 5 දරණ සමූපකාර පනත

(ii) 1983 අංක 32 දරණ සමූපකාර සමිති (සංශෝධන) පනත

(iii) 1992 අංක (11) දරණ සමූපකාර සමිති (සංශෝධන) පනත

(iv) 1994 අංක (03) දරණ සමූපකාර සමිති ප්‍රඥප්තිය

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමත් සමගම ඉහත සඳහන් පනත් හා ප්‍රඥප්තිය මෙම පළාත තුළ බල නොපැවැත්වෙන්නේ වුවද එම නීති හා ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන යටතේ පවත්වා ගෙන යාම සහ අදාළ ආනුෂංගික කටයුතු කිරීම නීත්‍යානුකූල සහ බලසහිත වන්නේය.

අර්ථ නිරූපනය

75. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍යවුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි අතුරු ව්‍යවස්ථා - යන්නෙන් තත්කාලයෙහි බලපවත්නා ලියාපදිංචි කළ අතුරු ව්‍යවස්ථා අදහස් වන අතර ඊට එම අතුරු ව්‍යවස්ථාවල ලියාපදිංචි සංශෝධන ද ඇතුලත් වේ.

කාරක සභාව යන්නෙන් ලියාපදිංචි කළ සමිතියක කටයුතු පිළිබඳව කළමනාකාරිත්වය භාර කරනු ලැබූ ඒ සමිතියේ පාලක මණ්ඩලය අදහස් වන අතර ලියාපදිංචි සමූපකාර සමිතියක අතුරු ව්‍යවස්ථානුකූලව පත්වන කාරක සභාව අධ්‍යක්ෂ මණ්ඩලය හා මෙම ප්‍රඥප්තියේ 48(2) 48(3) 48(8) 49(4) 60(3) හා 60(4) වෙනි වගන්ති යටතේ රෙජිස්ට්‍රාර් විසින් පත් කරන ලද තැනැත්තෝ ඇතුලත් වෙති. නිලධාරයා යන්නට සමිතියක හෝ එහි යම් ශාඛාවක හෝ ප්‍රාදේශීය කාරක සභාවක සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරිකවරයා හෝ කළමනාකාර අධ්‍යක්ෂවරයා හෝ සමිතියක කාරක සභාවක සාමාජිකයකු හෝ සමිතියේ කටයුතු සම්බන්ධයෙන් විධාන දීමට යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තකු ඇතුලත් වේ.

බැංකුව යන්නෙන්

(අ) මහජනයාගෙන් ඉල්ලුම් තැන්පත් මුදල් භාර ගැනීම හෝ ඉල්ලුම් තැන්පත් මුදල් ඇති කිරීමේ ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ කරගෙන යන නීති ගත කරනු ලැබූ හෝ නීති ගත කරනු නොලැබූ යම් පුද්ගලයෙක් හෝ පුද්ගල මණ්ඩලයක

(ආ) ආඥාවුව වෙනුවෙන් ක්‍රියාකරන්නා වූ හා ණය දීම අත්තිකාරම් දීම හෝ ආයෝජන කිරීම කරන්නාවූ මහජනයාගෙන් තැන්පත් භාර ගන්නා වූ (යම් ලිඛිත නීතියක් මගින් හෝ අන් ආකාරයකින් පිහිටුවනු ලැබූ) යම් නියෝජිත ආයතනයක් හෝ ආයතනයන්

(ඇ) ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාව සහ

(ඇ) සමුපකාර සංවර්ධන විෂය භාර කැබිනට් අමාත්‍යවරයා විමසා මුදල් විෂය භාර කැබිනට් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ආඥාවක් මගින්, මේ පනතේ කාර්යය සඳහා බැංකුවක් ලෙස ප්‍රකාශිත අන්කිසි පුද්ගලයෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

01. ප්‍රාථමික සමිතිය යන්නෙන් (3) වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් අරමුණක් ඇතිව හෝ යම් කාර්යයක් සඳහා පිහිටුවන ලද යම් සමිතියක් නොවන පුද්ගලයන් සාමාජිකයින් වන ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් අදහස් වේ.

02. සංගමය හෝ ද්විතිය සංගමය යන්නෙන් (3) වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් අරමුණක් ඇතිව හෝ යම් කාර්යයන් සඳහා පිහිටුවන ලද ලියාපදිංචි සමුපකාර සමිති සාමාජික වන සමිතියක් අදහස් වේ.

03. රීති යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ හෝ පනවනු ලැබූ ලෙස සලකන රීති අදහස් වේ.

04. රජයේ අරමුදල් යන්නෙන් පළාත් සභාව විසින් දෙනු ලබන ණය අත්තිකාරම් හා ප්‍රදාන අදහස් වන අතර මේ ප්‍රඥප්ති යටතේ හෝ රීති යටතේ පිහිටුවන ලද අරමුදල් වලින් දෙනු ලබන ණය ප්‍රදානයන් හෝ අත්තිකාරම් ඊට ඇතුළත් වේ.

05. රෙජිස්ට්‍රාර් යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ සබරගමුව පළාතේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ යුතුකම ඉටු කිරීම සඳහා පත් කරන ලද තැනැත්තෙක් අදහස් වේ.

06. ලියාපදිංචි කළ සමිතිය යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැලකෙන ප්‍රාථමික සමිති හෝ ද්විතීය සංගම් අදහස් වේ.

07. සාමාජිකයා යන්නට සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සහභාගි වන තැනැත්තෙක් ද ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු රීති හා අතුරුව්‍යවස්ථා අනුව සාමාජිකත්වයට ඇතුලත් කර ගන්නා ලද තැනැත්තෙක් ද අදහස් කෙරේ.

08. පූර්ණ සාමාජිකයා යන්නෙන් ලියාපදිංචි ප්‍රාථමික සමුපකාර සමිතියක සාමාජිකත්වයට බඳවා ගත් දිනයේ සිට එක් වර්ෂයක් ඉකුත් වී ඇති හා සමිතියේ අතුරු ව්‍යවස්ථානුකූලව එක කොටසකවත් වටිනාකම ගෙවා නිම කර ඇති සාමාජිකයකු අදහස් වේ.

09. අමාත්‍යවරයා යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ සබරගමුව පළාතේ සමුපකාර සංවර්ධන විෂය භාර ඇමතිවරයා ගේ යුතුකම් ඉටු කිරීම සඳහා පත් කරන ලද තැනැත්තෙක් අදහස් කෙරේ.

10. පළාත් සභාව- යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ සබරගමුව පළාත් සභාව අදහස් කෙරේ.

11. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන් යන්නෙන් සමුපකාර සංවර්ධන නිලධාරීන් දිස්ත්‍රික් නිලධාරීන් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (උප කොමසාරිස්) සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් හෝ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් අදහස් කෙරේ.

12. ඉහත ප්‍රඥප්තියේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතරේ යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

04-363

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.